# අධිරාජ්‍යවාදී
## මැදිහත්වීම්
## පැරදවීමට නම්...

# අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පැරදවීමට නම්...

නියමුවා ප්‍රකාශන

**අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පැරදවීමට නම්...**

© නියමුවා ප්‍රකාශන

ISBN 978-955-8696-??- ?

පළමු මුද්‍රණය - 2012 අප්‍රේල්

**මුද්‍රණය:**
ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

**ප්‍රකාශනය:**
නියමුවා ප්‍රකාශන
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**විමසීම්:**
දුරකථන:- +94112785612
ෆැක්ස්:- +94112786050
ඊ-මේල්:- niyamuwanews@gmail.com
වෙබ්:- www.jvpsrilanka.com

# වචනයක්

ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන අධිරාජ්‍යවාදී මැදිහත්වීම් ඉහළ යමින් තිබේ. එය ජිනීවා මානව හිමිකම් කොමිසම සම්මත වන යෝජනාවක සිට සහනාධාර කප්පාදු කිරීමට කෙරෙන නියෝගයක් දක්වා පරාසයක ක්‍රියාත්මකය. මේ අතර රාජපක්ෂ ආණ්ඩුව තමන්ට එල්ල වෙමින් ඇති ජනතා විරෝධයෙන් ගැලවීම සඳහා අධිරාජ්‍ය විරෝධී සටන්පාඨ පසුපස සැඟවීමට නිරර්ථක උත්සාහයක යෙදෙයි.

එහෙත් සැබැවටම අධිරාජ්‍යවාදී පැවැත්මට අදාල පරිසරය සකසන්නේත් මාර්ගය පාදා දෙන්නේත් අධිරාජ්‍ය ගැති ආණ්ඩුමය. මෙම දෙබිඩි බව තිබුණු ප්‍රශ්න කිරීමකට ලක් කරන ජනතා පෙරමුණ මෙම අධිරාජ්‍යවාදී මැදිහත්වීම් සහ ඊට පාරකපන ආණ්ඩුව සැබෑ අධිරාජ්‍යවිරෝධී පෙරමුණක් ගොඩනැගීම මගින් එක මිටකට ගෙන පරාජය කළ යුතු බව අවධාරණය කරයි. මේ දේශපාලන පසුබිම ආශ්‍රිත කරුණු පිළිබඳව ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා සහ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා දක්වන අදහස් මෙම පොත් පිංචට ඇතුළත්ය.

**නියමුවා ප්‍රකාශකයෝ**

**2012-04-26**

***01. ප්‍රශ්නයඃ- ශ්‍රී ලංකාව මේ වන විට විශාල අර්බුදයකට මුහුණ පා සිටින බව ඔබ පවසනවා. එසේ පැවසීමට හේතු කවරේද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** ශ්‍රී ලංකාව මේ මොහොතේදී දැවැන්ත බංකොලොත්භාවයකට මුහුණ දී තිබෙනවා. මේ බංකොලොත්කම ආර්ථික ක්ෂේත්‍රයේදී, විශේෂයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේදී, දේශපාලන ක්ෂේත්‍රයේදී, සමාජමය සදාචාරමය යන හැම ක්ෂේත්‍රයක් තුළම පැහැදිලි ලෙස දැකගන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මෙය වසංකරන්න දුර්වල උත්සාහයන් ගත්තත් රට ණය උගුලක හිරවෙලා ඉන්න බව හංගන්න බැහැ. ආණ්ඩුව ණය ගන්නකොට මේ ණයත්, ඒ ණයට පොලියත් ගෙවන්නෙ කොහොමද කියල කල්පනා කළේ නැහැ. ණය ගැනීම සීමා කළෙත් නැහැ. 2005 අවුරුද්දෙ ඉඳලා 2010 අග වන විට ආණ්ඩුව ගත්ත ණය කන්දරාව 2005 අවුරුද්ද දක්වා හැම ආණ්ඩුවක්ම ගත්ත මුළු ණය එකතුවට වඩා වැඩියි. මේක කෙනෙකුට විශ්වාස කරන්නත් අමාරු කථාවක් වෙන්න පුළුවන්. නමුත් ඕක තමයි තිත්ත ඇත්ත. දැන් ඉතින් සමහර ණය කල්පිරෙනවා. එතකොට ඒ ණයත්, ණයට පොලියත් ගෙවිය යුතුයි. මේ ණය කෙටි කාලයක් තුළදී කල්පිරෙනවා විතරක් නෙවෙයි. ඒවායේ පොලියත් ඉහළයි. කල් පිරෙන ණය ගෙවිය

යුතුමයි. නැත්නම් ලංකාවට විදේශවලින්, විදේශ බැංකුවලින් ණය ගන්න බැරි වෙනවා. ණයත්, ණයට පොලියත් ආපසු ගෙවන්න තරම් විදේශ වත්කම්, සරලව කිවුවොත් ''රට සල්ලි'' ලංකාව සතුව නැහැ.

ලංකාව 1948 ඉඳලා එකම එක අවුරුද්දකදි හැර අනික් හැම අවුරුද්දකදිම විදේශ ආදායමට වඩා හුඟක් වැඩියෙන් විදේශ වියදම් කෙරෙන ආකාරයට තමයි වැඩ කළේ. මේ ආණ්ඩුවත් මීට පෙර තිබුණු හැම ආණ්ඩුවමත් කළේ එහෙමයි. 2011 අවුරුද්දෙ රටේ වෙළඳ හිඟය 100%වෙලා. ඒ කියන්නේ අපේ රටේ අපනයන ආදායම වගේ දෙගුණයක් ලෙස ආනයන වියදම් වැඩිවෙලා. මෙය රටක ආර්ථිකයට ඉතා නරක ලෙස බලපානවා.

ඒ නිසා අපේ රටට දරුණු රට සල්ලි හිඟයක් තියෙනවා. රට සල්ලි අතින් අපි හොඳටම බංකොලොත්. ඒනිසාම තමයි ආණ්ඩුව ණය ගන්නේ. ගත්තු ණයත් ණයට පොලියත් ගෙවන්න තව තවත් ණය වෙන්නෙ.

ලංකාව මුහුණදීලා තියෙන අනික් අර්බුදය තමයි, ආණ්ඩුවේ වියදම් පියවා ගන්න ආණ්ඩුවේ ආදායම් මදිකම. නව ලිබරල් ධනවාදයට අනුව විවෘත ආර්ථිකයේ දෙවැනි ඉනිම ක්‍රීඩා කරන රාජපක්ෂ පාලනය රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීමට සමත් වුණේ නැහැ. අද ආණ්ඩුවේ ආදායම් මාර්ග බවට පත්ව තිබෙන්නේ ණය, බදු හා දඩයි. මෙය බරපතළ අර්බුදකාරී තත්වයක්.

ඉහත කී ප්‍රධාන අර්බුද දෙක නිසා ඒවායේ ප්‍රතිඵල හැටියට තවත් ප්‍රශ්න ගණනාවක් රට ඉදිරියේ පැනනැගී තියෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය, එපා කියපු ආණ්ඩුව දැන් වෙනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක හවුලේ ලාංකේය ජනතාව මත හිතන්න බැරි තරම් බර පටවනවා. එහෙම කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගත් ඇමරිකන් ඩොලර් කෝටි 260ක රට සල්ලි

ණයක් (ඇපයක්) වෙනුවෙනුයි. ආණ්ඩුව පළමු වටයේදීම තෙල් මිල, විදුලි බිල, බස් ගාස්තුව ආදිය සාහසික විදිහට වැඩිකළා. ඊළඟට ආණ්ඩුවේ ආදායම වැඩිකර ගැනීම සඳහා කාර්, ත්‍රීරෝද, මෝටර් සයිකල්, දුම්වැටි, අරක්කු, බීර ආදියේ බදු ඔරොත්තු නොදෙන තරමට වැඩිකළා.

ජාත්‍යන්තර මුල්‍ය අරමුදල කියන විදිහට රුපියල පාවෙන්න ඉඩ හැරියා. ඒ නිසා ඇමරිකන් ඩොලර් එකකට ගෙවිය යුතු රුපියල් ගණන 131 දක්වා ඉහළ ගියා. ඉදිරියේදී රුපියලේ අගය උඩට පහළට යනවා. අවසානයේදී රුපියලේ අගය පහළටම යන බව සහතිකයි. මොකද රට තුළ නිෂ්පාදනය වැඩිවෙන්නෙ නැහැ. ඒ වගේම අපිට වැඩි වැඩියෙන් රට සල්ලි ආදායම් ලැබෙන්න නැහැ. මේ දෙකම සිද්ධවෙන්නෙ නැහැ. ඒ නිසා රුපියලේ අගය පහත වැටීම වළක්වන්න ආණ්ඩුවට බැහැ.

මේ අතර කොටස් වෙළඳපොළ කඩා වැටෙනවා. මේ කොටස් වෙළඳපොළත් ලංකා රුපියලත් දැන් ලෝකයේ පතුළටම වැටිලා. යාන්තමින් බංගලාදේශයට උඩින් තියෙනවා. බංගලාදේශයේ ඩකා කොටස් වෙළඳපොළ තමයි ලෝකයේ අන්තිමයා. අපි අන්තිමයට උඩින් ඉන්නවා. ළඟදීම අන්තිමයා වීමේ ඉඩකඩත් හොඳටම තියෙනවා.

ඊළඟට බැංකුවල සල්ලි නැහැ. ද්‍රවශීලතාවය නැහැ. බැංකුවලින් ණය දීම ඉතා බරපතළ ලෙස සීමා කරන්න මහබැංකුව උපදෙස් දීලා තිබෙනවා. එතකොට ව්‍යාපාර, කර්මාන්ත සඳහා ණය ගන්න බැහැ. ව්‍යාපාර, කර්මාන්ත වැටෙනවා. තෙල් මිල, විදුලිබිල වැඩිවීම නිසාත් ව්‍යාපාර සහ කර්මාන්ත කරන්න බැහැ. එතකොට රැකියා නැති වෙනවා.

විදේශවලින් කිසිම දෙයක් ගේන්න එපා කියලා ඇමතිවරු කියනවා. ඒ රට තුළ නිෂ්පාදනය වැඩිකරන්න නෙවෙයි. රට සල්ලි නැතිනම් කොහොමද පිටරටින් ආනයනය කරන්නේ? අනික් අතින් අවුරුදු 30කට වඩා දිග කාලයක් තිස්සෙ හැම

ආණ්ඩුවක්ම ජනතාව අධිපරිභෝජනයට හුරුකළා. ඊනියා නව ලිබරල්වාදී ධනවාදය තුළ, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළ, ඊනියා ගෝලීයකරණය තුළ ඒක අනිවාර්යයෙන් කළ යුතුයි. ඒ තත්වය තුළ රට තුළ නිෂ්පාදනය වැඩි කරන්න අධිරාජ්‍යගැති ධනපති ආණ්ඩුවලට බැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු බැංකුව ආදී අධිරාජ්‍යවාදී ආයතන ඒකට ඉඩ දෙන්නෙත් නැහැ.

මේ මොහොතේ ශ්‍රී ලංකාව මුහුණදී ඇති දැවැන්ත ආර්ථික අර්බුදය පිළිබඳව මේ ඉතාම කෙටි විස්තරයක්.

දේශපාලන වශයෙන් සලකා බලන විටත් මහින්ද රාජපක්ෂගේ මේ ධනපති අධිරාජ්‍යගැති පාලනයේ අදූරදර්ශී බව නිසා ශ්‍රී ලංකාව තවත් දේශපාලන උගුලක හිරවුණු බවයි පෙනෙන්නේ. යුද්ධය අවසානයේ අප්‍රමාදව රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතීන්, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය ස්ථාපිත කරන්න, වගවීම පිළිබඳව නිසි බර තබන්න රාජපක්ෂ ආණ්ඩුව අසමත් වුණා.

ඒකෙ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවට එරෙහිව එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිළිබඳව කවුන්සිලය ඉදිරියේ යෝජනාවක් සම්මතවීම වළක්වන්න රාජපක්ෂ ආණ්ඩුව මුළුමනින්ම අසමත් වුණා. මේ නිසා ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය උල්ලංඝනය වුණා. ලෝකය ඉදිරියේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය අභිමානය විනාශ වුණා. ඒ නිසාම ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවට දේශපාලන අභියෝග වගේම ආර්ථික අභියෝගවලට පවා මුහුණ දෙන්න සිදුවිය හැකියි. මේ අභියෝගයේ බර ඒ අයුරින්ම සලකා වගකීමෙන් කටයුතු කරන බවක් නම් රාජපක්ෂ ආණ්ඩුව පෙන්වන්නේ නැහැ. මේ ප්‍රශ්නය දැවැන්ත දේශපාලන අර්බුදයක් කරා වැඩෙන්නට ආණ්ඩුව ඉඩකඩ විවරකර ඇති බව පේනවා.

ශ්‍රී ලංකාව දැන් මුහුණදෙමින් ඇති ආර්ථික, දේශපාලන අර්බුද තුළ මෙතෙක් පැවති සමාජ ප්‍රශ්න වඩා ගැඹුරු අර්බුදයක් කරා තල්ලුවීම වළක්වන්න රාජපක්ෂ ධනපති ආණ්ඩුවට කිසිදු

හැකියාවක් නැහැ. ආණ්ඩුව මොන තරම් බොරු කීවත් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් භාගයක්ම දුප්පතුන් බවට පත්වී තිබෙනවා. මුළු ජනගහනයෙන් 15% ක්ම අන්ත දරිද්‍රතාවයට වැටී සිටිනවා. ඒ කියන්නෙ දවසකට අවශ්‍ය අවම ආදායම ලෙස එක්සත් ජාතීන් පිළිගන්නා ඩොලර් 1 1/4ක මුදල ඒ කියන්නෙ රුපියල්වලින් 165ක් තරම්වූ ආදායමයක් නොලබන අයගේ සංඛ්‍යාව. ඇත්ත සංඛ්‍යාව නම් මුළු ජනගහනයෙන් 1/4ක්ම ඒ දුඛිත තත්වයට පත්වුනු අයයි. මන්දපෝෂණයෙන් පෙළෙන ළමයි සංඛ්‍යාව ළමා ජනගහනයෙන් 25%ක්.

රට සල්ලිත්, රට ඇතුළේ සල්ලිත් සීඝ්‍රයෙන් හිඳී යද්දී ජනතාවගේ මූලික අවශ්‍යතා වුණු කෑම-බීම, ඇඳුම්-පැළඳුම්, බෙත්-හේත්, අධ්‍යාපනය, රැකියා ආදී සමාජ ප්‍රශ්නත් සීඝ්‍රයෙන් වැඩිවෙනවා.

ආර්ථික, දේශපාලන හා සමාජ ප්‍රශ්න උග්‍රවෙද්දී රට සදාචාරමය වශයෙන් ඉහළ තැනක තියෙන්නෙ නැහැ. දුප්පත්කම වැඩිවෙන කොට අපරාධ වැඩිවෙනවා. ඒක දැන් අපේ ඇස් පනාපිට ප්‍රදර්ශනය වෙමින් තියෙනවා. 2011 අවුරුද්දෙදි දූෂණයට ලක්වූ පුංචි දරුවන් ගණන 1035ක්. ලිංගික අපයෝජනයට ලක්වූ ගණන 1503ක්. ළමුන් ඝාතන 22ක්. ළමුන් කප්පම් සඳහා පැහැරගෙන යෑම් 54ක්. ශ්‍රී ලංකාවේ මිනීමැරුම්, හොරකම්, වංචා, දූෂණ, මත්කුඩු, ජාවාරම් සියල්ල වැඩිවෙලා. නීතියේ හා විධානයේ ආධිපත්‍යය මුළුමනින්ම කඩාදාලා. අධිකරණ පද්ධතිය තම දේශපාලන වුවමනාකම් වෙනුවෙන් යොදාගැනීම නිසා අවනීතිය රජකරන තත්වයට පත්කරල. මේ ආයතන පිළිබඳ විශ්වාසය බිඳවැටිලා. මේවා සාධාරණ ආයතන නොවන බවත් මේවා ධනේශ්වර ආයතන බවත් ඇත්ත වුවත් රටක අරාජිකත්වය හා අවනීතිය රජ වෙමින් පැවතීමත් අවනීතිය හා හිතුවක්කාරී පාලනය වෙනුවෙන් නිල ආයතන හිතාමතාම දුර්වල කිරීමත් බරපතළ කරුණක්. එය ප්‍රජාතන්ත්‍රවිරෝධී හිතුවක්කාරී, වගවීමෙන් තොර පාලනයකට මඟ සලසා ගැනීමක්.

ඉතාම කෙටියෙන් ලංකාවේ වර්තමානයේදී මුහුණදී ඇති ගැඹුරු අර්බුදයේ ලක්ෂණ ඒ ආකාරයි.

***02. ප්‍රශ්නයː- මෑතකදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ලංකාවට එරෙහිව සම්මතවූ යෝජනාව පිළිබඳව විශාල දේශපාලන විවාදයක් රට තුළ මතුවුණා. මෙම තත්වය ඔබ දකින්නේ කෙසේද?***

*ටිල්වින් සහෝදරයාː-* පසුගිය මාර්තු 22 වනදා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී එක්සත් ජනපදය විසින් ඉදිරිපත්කොට සම්මතකරගනු ලැබූ ලංකාව පිළිබඳ යෝජනාව සැබෑ ලෙසම ලංකාව රටක් ලෙස ජාත්‍යන්තර තලයේ ලැබූ පරාජයක්. ඒ වගේම මෙය දිගුකාලීනව ලංකාවට අහිතකර ලෙස බලපානවා.(එම යෝජනාව මේ සමඟ අමුණා ඇත) මේ යෝජනාව මගින් ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත්වීමේ නිල අයිතිය අධිරාජ්‍යවාදීන් තබාගෙන තිබෙනවා. එහෙත් මෙම තත්වය තම පටු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් යොදාගන්නවා මිස වර්තමාන ආණ්ඩුව මෙහි අනතුර දකින්න සමත්වෙලා නැහැ. එය පරදවන්න සමත් වෙලත් නැහැ.

මෙය අපේ රටේ පසුගිය කාලයේ පැවති හැම ආණ්ඩුවකම තිබූ ලක්ෂණයක්. ලංකාවේ ජාතික ප්‍රශ්නය මගින් අධිරාජ්‍යවාදීන් ලංකාවේ අභ්‍යන්තර කටයුතු වලට අත පොවන විට එය හඳුනාගෙන ඊට ඇති අවකාශයන් අහුරනවා වෙනුවට හැම ආණ්ඩුවක්ම කළේ ඊට අවශ්‍ය මග සකස් කිරීමයි. අධිරාජ්‍යවාදීන් සමඟ අතිනත ගෙන කටයුතු කිරීමයි.

ලංකාවේ ජාතික ප්‍රශ්නය බෙදුම්වාදී සන්නද්ධ අරගලයක් බවට පත්වීමට පෙර මතවාදයක් ලෙස පැවති කාලයේ, ජාතිවාදී කෝලාහල විටින් විට සිදුවූ කාලයේ, ලංකාවේ ධනපති ආණ්ඩු හා ධනපති පක්ෂ තමන්ගේ බලය සඳහා ජාතිවාදය පාවිච්චි කළා මිස ජනතාව සමගි කරන දිසාවට, ජාතිවාදය පරදන දිසාවට කටයුතු කළේ නැහැ. සිංහල ධනපති පන්තිය සිංහල ජාතිවාදය අවුස්සද්දී දෙමළ ධනපති පන්තිය දෙමළ ජාතිවාදය වපුරමින් කටයුතු කළා. මේ ප්‍රශ්නය තම උපාය මාර්ගික වුවමනාවන්

සඳහාත් උපක්‍රමික අරමුණු සඳහාත් හොඳින්ම යොදාගත් අධිරාජ්‍යවාදීනුත් ඉන්දීය ආධිපත්‍යවාදීනුත් මෙය සන්නද්ධ අරගලයක් දක්වා පෝෂණය කළා. දෙමළ සන්නද්ධ කණ්ඩායම් පුහුණු කිරීමත් ඔවුන්ට අවි ලබාදීම හා මුදල් ලබාදීමත් සිදුකළේ ඉන්දියානු ආණ්ඩුව විසින්ම බව ඉතා ප්‍රකට කරුණක්.

මෙම ප්‍රශ්නය බෙදුම්වාදී යුද්ධයක් බවට පත්වීමෙන් අනතුරුවත් අධිරාජ්‍යවාදීනුත් ඉන්දීය ආධිපත්‍යවාදීනුත් බෙදුම්වාදී යුද්ධය තම දේශපාලන වුවමනාවන්ට යොදාගත්තා. 1987 ඉන්දුලංකා ගිවිසුමත් 2002 සටන්විරාම ගිවිසුමත් ඒ සඳහා පැහැදිලි උදාහරණ දෙකක්.

2009දී අධිරාජ්‍යවාදීනුත් ඉන්දියාවත් බලාපොරොත්තු නොවූ ලෙස එල්ටීටීය පරාජයට පත්වෙමින් යුද්ධය අවසන් වුණා. යුද්ධය අවසන්වූ පසු නිර්මාණය වූ නව දේශපාලන තත්වය ජනතාවට අයිතීන් ලබාදී ප්‍රජාතන්ත්‍රවාදය තහවුරුකොට ජාතික සමගිය ගොඩනැගීමේ දිශාවට පියවර තැබීමට යොදාග න්නවා වෙනුවට වත්මන් පාලනය එය තම බල ව්‍යාපෘතිය වෙනුවෙන් යොදාගත්තා. මේ තත්වය තුළ අධිරාජ්‍යවාදීන් හා ඉන්දීය ආධිපත්‍යවාදීන් යුද්ධයෙන් පසු 'මානව හිමිකම්' හා 'වගවීම' යොදාගනිමින් යළිත් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අත දැමීමට ක්‍රියාත්මක වුණා. යුද්ධය පැවති කාලයේවත් ඉටුකර ගැනීමට නොහැකිවූ කාර්යයක් යුද්ධය නිමාවී තිබියදී ඔවුන් ඉටුකර ගත්තා. ඒ ජිනීවා යෝජනා සම්මතකර ගැනීමයි. අතීතයේදී මෙන්ම මෙහිදීද රාජපක්ෂ පාලනය රට තුළ බොරු අධිරාජ්‍යවිරෝධයක් මවා පෙන්වමින් ජිනීවා නාඩගම රඟදැක්වූවා මිස සැබෑ ලෙසම අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පරාජය කිරීමට කටයුතු කළේ නැහැ. අවසානයේ ජිනීවා යෝජනාව සම්මත වීම වළක්වාලීමට අසමත්වීමෙන් වත්මන් ආණ්ඩුව ඔප්පු කළේ තමන්ට අධිරාජ්‍යවාදී යෝජනා පැරදවීමට හෝ රට රැකීමට නොහැකි බවයි. දැනුත් ආණ්ඩුව කටයුතු කරන්නේ අඳුරේ අතපතගාමින් ජනතාව නොමග යවමින් අධිරාජ්‍යවාදයට අවශ්‍ය ලෙසයි. දුබල හා පසුගාමී ධනපති ක්‍රමයක් තුළ ධනපති ආණ්ඩුවකින් මීට වඩා යමක් බලාපොරොත්තුවිය නොහැකියි.

***03. ප්‍රශ්නය :- ජිනීවා යෝජනා හා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අධිරාජ්‍යවාදී මැදිහත්වීම් අතර සම්බන්ධයක් තිබේද? එසේනම් ඔබ එය තේරුම් කරන්නේ කෙසේද?***

***සෝමවංශ සහෝදරයා:-*** පැහැදිලිවම ජිනීවා යෝජනා හා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීම අතර සම්බන්ධයක් තිබෙනවා.

අධිරාජ්‍යවාදය සමස්ත ලෝකයම ආර්ථික, දේශපාලන, යුද සංස්කෘතික, වශයෙන් යටත්කර ගැනීම සඳහා උපාය උපක්‍රම සකස් කර ක්‍රියාත්මක කරනවා. එසේ ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයත් ආරක්ෂක කමිටුවත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනු සංවිධාන වන ජිනීවා මානව හිමිකම් කවුන්සිලය වැනි ආයතනත් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි තවත් බොහෝ ආයතනත් යොදා ගන්නවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානය R2P (ආරක්ෂා කිරීමට ඇති අයිතිය) වැනි පෙනුමින් අතිශයින්ම මානවවාදී අයිතියක් මෑතකදී එයට පවරා ගත්තා. ඒ පිළිබඳ යෝජනාව එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගෙනල්ල සම්මත කරගත්තෙ අධිරාජ්‍යවාදී රටවල්වල නායකත්වයෙනුයි. ඉතින් වෙනත් රටවල් තුළ අභ්‍යන්තර ප්‍රශ්නවලට අතදාන්න අධිරාජ්‍යවාදයට ඇති වුවමනාව එයින් පැහැදිලි වුණා. ඒක කැපී පෙනෙන අවස්ථාවක්. එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදීනුත් ඉන්දියාවත් මේ වෙහෙසෙන්නේ ලංකාවේ ජනතාවගේ මානව හිමිකම් රකින්න නොවෙයි. දෙමළ ජනයාගේ අයිතීන් ලබා දෙන්නත් නෙවෙයි. ලංකාව ඔවුන්ගේ න්‍යාය පත්‍රය තුළ හසුරුවා ගැනීම සඳහා මාර්ගයක්, අවස්ථාවක් විවර කර ගැනීමටයි. එක්සත් ජනපදයේ ඇත්ත වුවමනාව මානව හිමිකම් රැකීම නම් ලංකාවේ මීට පෙර විවිධ අවස්ථාවල බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝණය වීම් වලදීත් මේ මැදිහත්වීම සිදුවෙන්න ඕනෑ. ඒත් එහෙම සිදු වුණේ නැහැ. ඔවුන් ලංකාවේ බෙදුම්වාදී යුද්ධය යොදාග නිමින් ලංකාව තුළ කිසියම් අරමුණක් වෙනුවෙන් ක්‍රියාත්මක

වුණා. යුද්ධය තුළ ඉටුකර ගැනීමට නොහැකිවූ එම අරමුණ ඉටුකර ගැනීම සඳහාම දැන් යුද්ධයෙන් පසු මානව හිමිකම් යොදාගෙන තිබෙනවා. ඒ සඳහා විවිධ බලපෑම් කරමින්, කමිටු පත්කරමින් වාර්තා සකස් කරමින් අවසානයේ තර්කානුකූලව ජිනීවා යෝජනා සම්මත කරගනු ලැබුවා.

ජිනීවා යෝජනා මගින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අධිරාජ්‍යවාදයට අත පෙවීමත් තේරුම් ගත යුත්තේ ඉහත සඳහන් කරන ලද පදනම මතයි.

***04. ප්‍රශ්නයඃ- රට තුළ මානව හිමිකම් උල්ලංඝනය වී තිබීමත් ප්‍රජාතන්ත්‍රවාදය බරපතළ තත්වයන්ට ලක්ව තිබීමත් තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි සංවිධාන ඒ සඳහා යම් මැදිහත්වීමක් සිදුකිරීම සාධාරණයි නේද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** ඇමරිකා එක්සත් ජනපදය වැනි අධිරාජ්‍යවාදී රටවලුත් ශ්‍රී ලංකාව වැනි හැම අතින්ම පුංචි රටවලුත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම සාමාජිකයෝයි. මේ සාමාජික රටවල් සියල්ලම එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියටත් ඊට එහා ගිය වෙනත් ගිවිසුම් ආදිය අතරින් සමහර ඒවාටත් අත්සන් තබා පිළිගෙන තියෙනවා. ඒ නිසා ඒ ගිවිසුම් අනුව කටයුතු කිරීමට ඒ රටවල් බැඳී ඉන්නවා. එය එසේ පිළිගන්නවානම් මානව අයිතීන් කඩකළොත් ශ්‍රී ලංකාවටත් ඇමරිකා එක්සත් ජනපදයටත් එරෙහිව එක්සත් ජාතීන්ගේ සංවිධානය දෙබිඩි ක්‍රියාමාර්ග අනුගමනය නොකළ යුතුයි. හැම රටකටම සමාන පදනමක් තිබිය යුතුයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයක් ලෝකයට අවශ්‍ය තමයි. ඒත් එය සර්ව සාධාරණ විය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි. එය අධිරාජ්‍යවාදය ශක්තිමත් කිරීම සඳහා යොදා ගැනීමට ඉඩ නොතිබිය යුතුයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය යනු එක්සත් ජනපදයමයි යන අදහසක් ලොව තුළ පවතින්නේ එම සංවිධානය සර්ව සාධාරණ නැති නිසයි. ඒ නිසා මේ සිදුවන අභ්‍යන්තර ප්‍රශ්නයට මැදිහත්වීම හෙළා දැකිය යුතුයි.

කෙසේ වුවද ශ්‍රී ලංකා ආණ්ඩුව අද හිරවී ඇති උගුල කල් තබා දැකීමටත් ඒ අනුව පියවර ගැනීමටත් අපොහොසත්වීම පිළිබඳව මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත් වගකිව යුතුයි.

*05. ප්‍රශ්ණයඃ- ඒ අනුව වර්තමාන ලෝකය තුළ අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වල ස්වරූපය කවරාකාරද?*

*ටිල්වින් සහෝදරයාඃ-* වර්තමාන ලෝකයේ අධිරාජ්‍යවාදී මැදිහත්වීම් විශාල පරාසයක් තුළ පැතිරිලා තිබෙනවා. ඒවා විවිධ ආකෘති මගින් විවිධ අවස්ථා හා හේතු යොදාගනිමින් විවිධ ආකාරයන්ගෙන් ක්‍රියාත්මක වෙනවා. අධිරාජ්‍යවාදයේ සමස්ත ඉතිහාසයම පිරී පවතින්නේ ලේ වැකි කුමන්ත්‍රණවලින්, ආක්‍රමණවලින්, යටත්කරගැනීම්වලින්, ආණ්ඩු පෙරළි වලින් හා ආණ්ඩු හීලෑකරගැනීම්වලිනුයි. අධිරාජ්‍යවාදීන් පසුගිය 20වන සියවස තුළ ලෝක යුද්ධ දෙකක් කළ බව අමතක කළ යුතු නැහැ. ලොව සමාජවාදී කඳවුර පවතිද්දී එය බිඳ දැමීම සඳහාත් සමාජවාදය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහාත් ඔවුන් ක්‍රියාත්මක වුණා. දැන් සමාජවාදී කඳවුරක් නැති තත්වය තුළ ලැබුණ ඉඩ යොදාගනිමින් ලොව රටවල් තම ආධිපත්‍යය තුළ තබාගැනීමට මැදිහත් වෙනවා. තෙල් වැනි වටිනා සම්පත් කොල්ලකෑමට රටවල් ආක්‍රමණය කරනවා. විශේෂයෙන්ම නව ලිබරල්වාදය තුළ මේවන විට අධිරාජ්‍යවාදය බරපතළ අර්බුදයකට ලක්වෙලා තියෙනවා. ඒ අනුව සිය ආර්ථික, දේශපාලන, යුධමය වුවමනාවන් වෙනුවෙන් උපායමාර්ගික මෙන්ම උපක්‍රමික අරමුණුද වෙනුවෙන් තමන්ට හිතකර භූ දේශපාලනයක් ලොවපුරා පවත්වාගෙන යාම වෙනුවෙන් අධිරාජ්‍යවාදීන් එක් එක් රටවලට එක් එක් ආකාරයන්ගෙන් මැදිහත්වෙනවා. ඒවා සෘජු ආක්‍රමණවල සිට විවිධ බලපෑම් කිරීම දක්වාත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව වැනි මූල්‍ය ආයතන මගින් හීලෑකරගැනීම්වල සිට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ සංවිධාන මගින් යට කරගැනීම දක්වාත් පැතිරී පවතිනවා. ''මානව හිමිකම්'' හා ''වගවීම'' අවියක් ලෙස යොදාගන්නේත්

එහිදීයි. මෙහි තවත් විශේෂ කරුණක් තියෙනවා. අධිරාජ්‍යවාදීන් මැදිහත්වෙන්නේ අධිරාජ්‍යවිරෝධී රටවලට පමණක් නොවෙයි. අධිරාජ්‍ය ගැති රටවල් එම ගැතිභාවය තුළ තව තවත් නිවට කර ගැනීම සඳහාත් ඔවුන් මැදිහත්වෙනවා.

70, 80 දශකවල අධිරාජ්‍යවාදීන් සමාජවාදී රටවලට එරෙහිව බරපතළ ලෙස ක්‍රියාත්මක වුණා. එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන් වියට්නාමය ආක්‍රමණය කළා. 1975 ද වියට්නාමයේදී පරාජය ලැබුවත් ඔවුන් එහි විශාල විනාශයක් කළා. නිකරගුවාවේ සැන්ඩිනිස්ටා පාලනය පැවති කාලයේ, 1970 දශකයේ අග හා 80 දශකය පුරා ප්‍රතිවිප්ලවකාරී කොන්ට්‍රාවරුන්ට එක්සත් ජනපදය උදව් කළා. ඉරාන-ඉරාක යුද්ධයේදී ඉරානයට හොරෙන් අවි විකුණා එම මුදල් කොන්ට්‍රා කැරලිකරුවන්ට දුන් බව ජාත්‍යන්තර අධිකරණයේදී පවා ඔප්පු වුණා. ඇෆ්ගනිස්ථානයේ 1978 බිහිවූ සෝවියට් හිතවාදී පාලනය පෙරළා දැමීමට මුස්ලිම් අන්තවාදීන්ට අවි දුන්නා. අල්කයිඩා නිර්මාණය කළෙත් එක්සත් ජනපදයමයි. ඒ වගේම 1980 කාලයේ ග්‍රෙනෙඩාවේ වාමාංශික ආණ්ඩුව ආක්‍රමණය කර පෙරළා දැම්මා. සමාජවාදී කියුබාවට එරෙහිව ආක්‍රමණ හා කුමන්ත්‍රණ රැසක් කළා. ලොව පුරා හමුදා කඳවුරු පවත්වාගෙන ගියා. ඉන්දියන් සාගරයේ දියාගෝ ගාර්ෂියාවල. පිලිපීනයේ, දකුණු කොරියාවේ, ජපානයේ (ඔකිනාවාවල) ආදී ලෙස ලොව පුරා හමුදා කඳවුරු රැසක් පවත්වාගෙන ගියා. තවමත් පවත්වාගෙන යනවා.

මෑතකදී එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන් ඉරාකයේ සදාම් හුසේන් පාලනය කුවේටය ආක්‍රමණය කිරීමේ සිදුවීම යොදාගෙන ඉරාකය ආක්‍රමණය කොට එය අත්පත් කර ගත්තා. එහෙත් ඊශ්‍රායලය පලස්තීන භූමිය ආක්‍රමණය කිරීම ගැන ඊශ්‍රායලයට එරෙහිව වචනයක්වත් කතාකරන්නේ නැහැ. ඒ වගේම අල්කයිඩා භීතියක් මවා ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කළා. ලිබියාවේ අභ්‍යන්තර ගැටලු යොදාගෙන මෑතකදී

ලිබියාවට පහරදී ගඩාෆිගේ පාලනය පෙරලා දැම්මා. ගඩාෆි පාලනයෙන් පහකරන කාලය වන විට ඔහු එක්සත් ජනපද විරෝධියෙක් නොවෙයි. ඔහු බටහිරට යටත්වෙමිනුයි සිටියේ.

මෙලෙස සෘජු ආක්‍රමණවලට අමතරව අධිරාජ්‍යවාදීන් බෙදුම්වාදය මගින් ලොව රටවලට මැදිහත් වුණා. කොසෝවෝ ප්‍රශ්නය මගින් සර්බියාවට මැදිහත් වුණා. සුඩානය දෙකඩ කිරීමට කටයුතු කළා. එවැනි උදාහරණ රැසක්ම තියෙනවා. න්‍යෂ්ටික අවි පිළිබඳ චෝදනා කරමින් උතුරු කොරියාවට තර්ජනය කරනවා. ඉරානයටත් තර්ජනය කරනවා. මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතාකරමින් කියුබාවට එරෙහිව සම්බාධක පනවා තිබෙනවා. නැගෙනහිර යුරෝපීය රටවල තම බලය ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් ඉන්නවා. ලතින් ඇමරිකාව තුළත් එලෙස කටයුතු කරනවා. ඒ ඒ රටවල් තම න්‍යාය පත්‍රයට යට කරගැනීම සඳහා ඒ ඒ රටවල විවිධ අභ්‍යන්තර ගැටලු යොදාගන්නවා. තමන්ට අවශ්‍ය වූ විට රටවල අභ්‍යන්තර කණ්ඩායම්වලට උදව්කරමින් ඔවුන් තම වුවමනාවන්ට මෙහෙයවනවා. විවිධ බාහිර තර්ජන මවා පෙන්වා ඒ මගින් තමන්ට අවශ්‍ය රටවල හමුදා කඳවුරු පවත්වාගෙන යනවා. දකුණු කොරියාව ඊට උදාහරණයක්. මෑතකදී එක්සත් ජනපදය 'ඇමරිකානු සියවසක්' ගැන කථා කළා. ඒ වගේම BACK TO ASIA ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගුවා. ඒ තම දේශපාලන ආධිපත්‍යය ආසියාව තුළ යළි තහවුරු කර ගැනීමටයි. මේ නිසා අධිරාජ්‍යවාදී මැදිහත්වීම සරලව තේරුම් ගැනීම වැරදියි. සැබෑ අධිරාජ්‍යවිරෝධීන් කළ යුත්තේ, අධිරාජ්‍යවාදීන්ට තමන්ගෙ රටවල අභයන්තර ප්‍රශ්නවලට අත පෙවීමට ඉඩ ලබා නොදීමයි. එලෙස ඉඩ ලබා දුන් හැම රටකටම අධිරාජ්‍යවාදීන් කඩා වැදුණා. ඔවුන්ගේ දේශපාලන න්‍යායපත්‍රයට යටකරගත්තා. ලංකාව සම්බන්ධයෙනුත් දැන් සිදුවෙමින් තිබෙන්නේ එයයි. එය වළක්වනවා වෙනුවට රාජපක්ෂ පාලනය ඊට ඉඩ විවර කරමින් ඉන්නවා.

***06. ප්‍රශ්නය:- අවුරුදු 30ක් පැවැති යුද්ධය අවසන්වූ පසු ඇති වූ තත්වය ඔබ දකින්නේ කෙසේද?***

***සෝමවංශ සහෝදරයා:-*** අවුරුදු 30ක් පැවති යුද්ධය අවසන්වූ පසුව උතුරු පළාතේත්, නැගෙනහිර පළාතේත් පැන නැගුණේ කනගාටුදායක තත්වයක්. ඒ පළාත්වල ජනතාව අතරින් ලක්ෂ 4කට ආසන්න විශාල පිරිසක් අවතැන් වුණා. ඒ අතරින් බොහෝ දෙනෙකුට ඉතිරි වුණේ ඇඳිවත විතරයි. ඊළඟට මේ විශාල පිරිස අවතැන් කඳවුරු තුළට ගාල්කරනු ලැබුවා. ඒ කඳවුරු මිනිස් වාසයට කිසිසේත්ම සුදුසු වුණේ නැහැ. කෑම බීම සැපයීම ඉතාම අක්‍රමවත් වුණා. ඒ වගේම ඒ කෑමත් මිනිස් පරිභෝජනයට සුදුසු වුණේ නැහැ. කඳවුරුවල සිටි ජනයා අව්වට වේලුණා. වැස්සට තෙමුණා. කඳවුරු තුළ ලෙඩරෝග පැතිරුණා. හරියාකාරව ප්‍රතිකාර සැපයුණේ නැහැ. කඳවුරු ජීවිතය එපාවූ සමහරු සිය දිවි හානි කර ගත්තා.

යුද්ධය අවසන් වුණාට ඒ පළාත්වලට සාමාන්‍ය තත්වය ඇතිකරන්න ආණ්ඩුව සමත් වුණේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් ඒ අවස්ථාවේ කල්පනා කළේ, යුද ජයග්‍රහණය තම ජයග්‍රහණය කරගෙන තවදුරටත් බලය රැකගන්න කටයුතු සකස් කිරීමයි. ඒ සඳහා ජනාධිපතිවරණය නියමිත කාලයට කලින් පැවැත්වුවා. තවත් අවුරුදු 6කට බලය ඩැහැගත්තා. ඊට පස්සෙ මහ මැතිවරණය පැවැත්තුවා. ජනතාවගෙන් 2/3 බලය ඉල්ලුවා. ජනතාව 2/3 බලය දුන්නෙ නැහැ. නමුත් සුජාත නොවන ආකාරයට පාර්ලිමේන්තුව තුළ 2/3 බලය හදාගත්තා. ඒ ප්‍රජාතන්ත්‍රවාදී නොවන 2/3 බලය පාවිච්චි කරල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය අහෝසි කරලා 18 වැනි සංශෝධනය සම්මත කර ගත්තා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කරන්න අපොහොසත් වුණා. උතුරු පළාතට සිවිල් පාලනය ගේන්න අසමත් වුණා. රටට ආර්ථික සංවර්ධනය ලබා දෙන්න අසමත් වුණා. ජාතික සමගිය, ප්‍රතිසන්ධානය ඇතිකරන්න කිසිවක් කළේ නැහැ. විරුද්ධවාදීන්, මාධ්‍යවේදීන්

අතුරුදහන් කළා. මර්දනය කළා. වගවීම පිළිබඳ කාරණා පිළිබඳව නොසලකා හැරියා.

යුද්ධය නිමාවීමත් සමග රටේ දේශපාලනය නව තත්වයක් වෙත පිවිසුණා. නව දේශපාලන තත්වයක් නිර්මාණය වුණා. බෙදුම්වාදයේ සන්නද්ධ පෙරමුණ පරාජයට පත්වුණා. එල්.ටී.ටී.ඊ.යේ සන්නද්ධ බලය අවසන් වුණා. යුද්ධය විසින් යටපත්ව තිබූ ආර්ථික ගැටලු සමාජීය ප්‍රශ්න, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් ආදී ප්‍රශ්න මතුපිටට ආවා. ඉන් සමහර කරුණු විසඳීමේ දෙසට ප්‍රායෝගික පියවර තැබීමේ ඉඩකඩක් විවර වුණා. ජාතික සමගිය සඳහා පියවර ගතහැකි වටපිටාවක් නිර්මාණය වුණා. දෙමළ ජනතාවගේ අත්‍යවශ්‍ය ගැටලු වලට විසඳුම් ලබාදිය හැකි හා දියයුතු වටපිටාවක්ද නිර්මාණය වුණා.

***07. ප්‍රශ්ණයඃ- රාජපක්ෂ පාලනය එම දේශපාලනික අනගි අවස්ථාව රටේ ජාතික සමගිය දිශාවට යොදාගැනීමට සමත්වුණාද?***

***ටිල්වින් සහෝදරයාඃ-*** ඇත්තටම ඔවුන් ඊට සමත් වුණේ නැහැ. ලංකාවේ සියලු ජනතාවන්ට සමානතා පදනම මත අයිතීන් ලබාදෙමින්, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින් ලංකාවේ ජාතික ගැටලුව විසඳීමට ධනපති ක්‍රමය තුළ ධනපති ආණ්ඩුවකට හැකියාවක් නැහැ. ඔවුන්ට ජාතික ප්‍රශ්නය විසඳිය හැකියි යන මිත්‍යාවේ අපි නැහැ. ඒත් යුද්ධය නිමාවීමත් සමග උදාවූ අවස්ථාව දෙමළ ජනයාගේ මූලික වුවමනාවන් ඉටුකරමින් ඔවුන් ජාතික සමගියේ දෙසට නැඹුරුකර ගැනීම සඳහා ප්‍රතිසංස්කරණමය කාර්යයන් රැසක් කිරීමට ඉඩ තිබුණා. ආණ්ඩුව එය කළයුතුව තිබුණා. දෙමළ ජනයා තවදුරටත් බෙදුම්වාදී දේශපාලනයේ ගොදුරක්වීම වැළැක්වීම සඳහා අත්‍යාවශ්‍ය පියවර ගතයුතුව තිබුණා. එහෙත් ආණ්ඩුව යුද ජයග්‍රහනවලින් මත්වෙලා උමතු විලාසයකිනුයි කටයුතු කළේ. උතුරේ අවතැන්වූවන් යළි පදිංචිකිරීමට, ඔවුන්ගේ ඉඩම් පිළිබඳ ප්‍රශ්ණ කඩිනමින් විසඳා දීමට කටයුතු කළේ නැහැ. ඒ වෙනුවට බොරුකළා.

අතුරුදහන්වූවන්ගේ ගැටළු ගැන සිරගතවූවන් සමාජගත කිරීම ගැන සලකා බැලුවේවත් නැහැ. උතුරේ ජනයා මත තිබූ එල්.ටී.ටී.ඊ. බලහත්කාරය එල්.ටී.ටී.ඊ.යේ පරාජය නිසා ඉවත් වුවත් ඒ සමගම ආණ්ඩුවේ බලහත්කාරයද ඉවත්කර සාමාන්‍ය ජීවිතය පවත්වාගෙන යාමට හැකි ලෙස සිවිල් පාලනය තහවුරු කළේ නැහැ. මේ වගේ පහසුවෙන් කළ හැකිව තිබූ දේවල් පවා නොකර හිතුවක්කාරී ලෙස කටයුතු කළා. අධිරාජ්‍යවාදීන්ට හා ඉන්දියාවට මෙම තත්වය වාසිදායක වුණා. මෙම තත්වය තමයි ඔවුන් යොදාගත්තේ .

මේ අනතුර කල්තියා දුටු ජවිපෙ අවස්ථා කිහිපයකදීම මේ සඳහා වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කළා. යුද්ධය නිමාවී සතියක් ගතවෙද්දී 2009 මැයි 27වෙනිදා ජවිපෙ වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. එහි පළමු යෝජනාව වුණේ උතුර හා නැගෙනහිර යළි ගොඩනැගීම සඳහා සියලු ජනකොටස් සහභාගී කරගැනීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂවලින් සමන්විත කාර්ය සාධක මණ්ඩලයක් ගොඩනැගිය යුතු බවයි. එහෙත් ආණ්ඩුව ඒවා සැලකිල්ලට ගත්තේ නැහැ. යළිත් 2009 ජූලි 15දා ''දෙමළ ජනයා මුහුණදී ඇති දුෂ්කරතාවයන් හා ගැටලු අවම කිරීම සඳහා වූ ප්‍රායෝගික මැදිහත්වීමක්'' නමින් කරුණු ගණනාවක වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. එමගින් දෙමළ ජනයාගේ හදිසි ආර්ථික, සමාජීය, දේශපාලන ගැටලු භාෂාමය හා පරිපලන ගැටළු විසඳීම සඳහා යෝජනා රැසක් ඉදිරිපත් කළා. මේ කිසිවක් සැලකිල්ලට නොගත් ආණ්ඩුව යුද ජයග්‍රහණ මගින් තම දේශපාලන බලය වැඩිකර ගැනීමටත් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් කොල්ලකෑමට එම ප්‍රදේශවල ජනතාවගේ ඉඩම් සහ සම්පත් ඉන්දියාවට හා අධිරාජ්‍යවාදී සමාගම්වලට ලබාදෙමින් ඒ මගින් මුදල් හම්බ කිරීමට කටයුතු කළා. එලෙස යුද්ධය නිමාවීමෙන් පසු ජාතික සමගිය ගොඩනැගීමේ දිසාවට වාසිදායක ලෙස නිර්මාණය වී තිබූ අවස්ථාව මුළුමනින්ම අත්හැර එය ලංකාවට එරෙහිව මැදිහත්වීම සඳහා යොදා ගැනීමට අධිරාජ්‍යවාදීන්ට අවස්ථාව

ලබා දුන්නා. බෙදුම්වාදී දේශපාලන මතවාදය යළි තහවුරු කිරීමට අවශ්‍ය පරිසරය බෙදුම්වාදී බලවේගවලට ලබාදුන්නා.

***08. ප්‍රශ්නයඃ- යුද්ධයෙන් පසු විශේෂයෙන්ම උතුරු පළාතේ අවතැන්වූ ජනතාවගේ ප්‍රශ්න නොවිසඳීම, අතුරුදහන්වීම, සුදුවෑන් සංස්කෘතිය රට තුළ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමිකිරීම මර්දන නීති පවත්වාගෙන යාම වැනි කරුණු මගින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් බරපතළ අනතුරුදායක තත්වයකට පත්වීම ප්‍රතික්ෂේප නොකළ යුතුයි නේද?***

*ටිල්වින් සහෝදරයාඃ-* පැහැදිලිවම යුද්ධය අවසන් වීමෙන් පසු රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනගනවා වෙනුවට ආණ්ඩුව කළේ යුද ජයග්‍රහණය මගින් ලබා ගත් බලය යොදාගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කිරීමට කටයුතු කිරීමයි. ආණ්ඩුව යුද්ධයේ ජයග්‍රහණය හිතුවක්කාරී ලෙස හැසිරීම සඳහා වූ 'ලයිසන් එකක්' බවට පත්කර ගත්තා.

ආණ්ඩුව තමන්ට අවනත නොවන ජනමාධ්‍ය මර්දනයට පියවර ගත්තා. මාධ්‍යවේදීන්ට පහර දුන්නා, මරා දැම්මා. සමහරු අතුරුදහන් ලයිස්තුවට වැටුණා, මාධ්‍ය ආයතනවලට පහර දුන්නා. ඒ වගේම දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කිරීමට පියවර ගත්තා. සරත් ෆොන්සේකා සිරගත කිරීම එක් උදාහරණයක් පමණයි. සුදු වෑන්වලින් පැහැරගැනීම් සිදුවුණා. ඒ වගේම ජනතාවගේ සාමකාමී විරෝධතාවලට පහරදුන්නා. කඳුළුගෑස් ජලප්‍රහාර එල්ල කළා. 2011 මැයි නිදහස් වෙළඳකලාපයේ සේවක උද්ඝෝෂණයට වෙඩිතියල රොෂේන් නැමති සේවකයා ඝාතනය කළා. 2012 පෙබරවාරි ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව සිදුකළ උද්ඝෝෂණයේදී ආණ්ඩුව සිදුකළ වෙඩිතැබීමකින් ඇන්තනී ප්‍රනාන්දු නම් ධීවරයා මිය ගියා. මීට අමතරව උතුරු ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජනජීවිතයට විශාල බාධාවක් කරමින් හමුදාව මැදිහත්වෙනවා. එලෙස අර්ධ මිලිටරි පාලනයක් ගෙනයනවා. මෙය ඉතාම බරපතළ තත්වයක්. මේ නිසා පොදුවේ ජනතාව බියට පත්ව සිටිනවා. උතුරේ ජනයා

නැවත බෙදුම්වාදය වෙතට තල්ලුවීමේ අනතුරද තියෙනවා. අනෙක් පැත්තෙන් එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ටත් ඉන්දියාවටත් මෙම තත්වය උපයෝගී කරගෙන ලංකාව තම න්‍යායපත්‍රයට හසුරුවා ගැනීම සඳහා මානව හිමිකම් දඩමීමා කරගැනීමටත් ඉඩ සකස් කරලා තියෙනව. ඒ නිසා අධිරාජ්‍යවාදී මැදිහත්වීමට විරුද්ධ වෙද්දීම ආණ්ඩුවේ මානව විරෝධී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයටත් විරෝධය පළ කළ යුතු වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගල කළ යුතු වෙනවා. ලංකාවට එරෙහිව සිදුවන අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට එරෙහිව ආණ්ඩුව සමඟ එකට කටයුතු කළ නොහැක්කේ හා කටයුතු නොකළ යුත්තේ ඒ නිසයි.

***09. ප්‍රශ්නයඃ- එල්.එල්.ආර්.සී. වාර්තාව පිළිබඳ ඔබගේ ඇත්තේ විවේචනයක්. ඒ ඇයි.***

***සෝමවංශ සහෝදරයාඃ-*** එල්.එල්.ආර්.සී. (උගත් පාඩම් හා ජාතික ප්‍රතිසන්ධාන කොමිසම) පිහිටුවන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කලබල වෙන්නේ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බෑන්කී මූන්, දරුස්මාන් කමිටුව පත් කළාට පස්සෙයි. එ.ජා.මහ ලේකම් වරයා දරුස්මාන් කමිටුව පත්කළේ ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන අදියර තුළදී සිදු වුණේ යයි කියන යම් යම් යුධ අපරාධ සිද්ධි පිළිබඳව සොයාබලා තමන් වෙත තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙමිනුයි. ඉතින් ලංකාව කොමිසම පත් කළ යුතු වුණේ දරුස්මාන් කමිටුවට ප්‍රතික්‍රියාවක් ලෙස නොවෙයි. ඊට කලින් 2009දී.

ඊළඟට මේ කොමිසම පත් කරන්නේ 2002 පෙබරවාරි මාසෙ 22 දා, ඒ කියන්නෙ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහත් කොටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරනුත් සටන් විරාම ගිවිසුම අත්සන් කළ දිනයේ සිට 2009 මැයි මාසෙ යුද්ධය අවසන් වූ දිනය දක්වා වූ කාලය තුළ සිදුවූ සිද්ධීන් පිළිබඳව සොයා බලා ආණ්ඩුව ගත යුතු පියවර නිර්දේශ කරන්නයි.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය පිළිබඳවත් උගත යුතු පාඩමක් පිළිබඳවත් ජාතික ප්‍රතිසන්ධානය ඇති කිරීම සඳහාත් ආණ්ඩුව ගත යුතු පියවර කවරේදැයි නිර්දේශ කිරීම සඳහා ඉහත සඳහන් කෙටි කාලපරිච්ඡේදය තුළ සිදුවූ සිද්ධීන් පිළිබඳව පමණක් සොයා බැලීම කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයේ උපතේ සිට ඒ ප්‍රශ්නය පිළිබඳව සොයා බැලිය යුතුයි.

ඊට අමතරව උගත් පාඩම් හා ජාතික ප්‍රතිසන්ධාන කොමිසම කරුණු සොයා බැලීමේදී කොමිසම ඉදිරියේ කරුණු දැක්වීමට මහජනතාවට ප්‍රමාණවත් කාලයක් ලබා නොදුන් බවටද පැමිණිල්ලක් තිබෙනවා. ඒ වගේම මේ කොමිසමේ නිර්දේශ ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීමට සමත් කිසිවක් ඉදිරිපත් කරල නැහැ. මෙහි පිළිගත හැකි කරුණු වගේම පිළිගත නොහැකි කරුණුත් තිබෙනවා. මෙය ප්‍රශ්නය මගහැර යාම සඳහා ගත් ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලයක් මිස සැබෑ ලෙසම ප්‍රශ්නය විසඳීමට ගත් පියවරක් ලෙස දකින්න පුළුවන්කමක් නැහැ. වසර 30ක් පුරා පැවති සමස්ත යුද්ධයෙන්ම උගත යුතු පාඩම් මේ තුළ අඩංගු වෙන්නේ නැහැ. ඒ වගේම ලංකාවේ ජාතික ප්‍රශ්නය මහා පරිමාණ යුද්ධයක් දක්වා වර්ධනය වීමට බලපෑ සැබෑ සමාජ, ආර්ථික, දේශපාලන හේතු හෝ ඒ තුළ ලංකාවේ පාලකයින්ගේ ක්‍රියාකාරිත්වය සිංහල හා දෙමළ ජාතිවාදයේ බලපෑම, අධිරාජ්‍යවාදීන් හා ඉන්දියාව මේ සඳහා කළ මැදිහත්වීම වැනි අත්‍යාවශ්‍ය කරුණු අඩංගු වෙලා නැහැ. මෙය නිවැරදි හෝ සමබර සංයුක්ත ලියවිල්ලක් නොවන්නේ ඒ නිසයි.

***10. ප්‍රශ්නයඃ- එල්.එල්.ආර්.සී. වාර්තාවද ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට සහ මානව හිමිකම් ආරක්ෂා කිරීමට යෝජනා කරනවා. එබැවින් එයට විරුද්ධ වීම ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනය ආරක්ෂා කිරීමක් නේද?***

***ටිල්වින් සහෝදරයාඃ-*** උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පත්කළේ කෙසේද? එය පරීක්ෂණ පවත්වා වාර්තාව නිකුත්

කළේ කෙසේද හා කුමණ අරමුණකින්ද යන කරුණු අපි දැනටමත් පැහැදිලි කර තියෙනවා. එල්.එල්.ආර්.සී. වාර්තාවේ මානව හිමිකම් රැකීමට අදාල කරුණු තිබෙන බව ඇත්ත. ඒ අතරම එහි රටට අහිතකර යෝජනාත් තියෙනවා. බලය බෙදීම වැනි නිර්දේශත් තියෙනවා. මෙම වාර්තාව අධිරාජ්‍යවාදීන්ට වාසිදායක වෙලා තිබෙන්නේ ඒ අනුවයි. මෙම වාර්තාවේ පිළිගත හැකි කරුනු මෙන්ම පිළිගත නොහැකි කරුණුත් තියෙනවා. අනෙක් අතට ආණ්ඩුවට මානව හිමිකම් රැකිය හැකිනම් ආණ්ඩුව මානවහිමිකම් ආරක්ෂා කිරීමට සැබවින්ම සූදානම්නම් ඊට කොමිෂන් සභා හෝ ඒවායේ නිර්දේශ අවශ්‍ය වන්නේ නැහැ. කොමිෂන් නැතත් එය කළ හැකිවිය යුතුයි. මානවහිමිකම් රැකීමේ හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ නිර්දේශ වලට මුවාවෙලා ජනතාව බෙදන, ජාතික අසමගිය ඇති කරන යෝජනා ක්‍රියාත්මක කිරීමට එල්.එල්.ආර්.සී වාර්තාව යොදාගන්නවාට අපි එකඟ නැහැ. අපි ආණ්ඩුවට බල කරන්නේ, වහාම මානව හිමිකම් රැකීමටත් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමටත් පියවර ගන්නා ලෙසයි. එය කළ යුත්තේ, කොමිෂන් වාර්තාවල නිර්දේශ අනුව හෝ විදේශ රටවලින් කරන බලපෑම නිසා නොවෙයි. සැබෑ ලෙසම රට තුළ මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය රැකීම ආණ්ඩුවේ වගකීමක් වන නිසයි.

*11. ප්‍රශ්නයඃ- ජ.වි.පෙ. දකින ආකාරයට පශ්චාත් යුද තත්වය කළමනාකරණය කළ යුතුව තිබුණේ කෙසේද?*

*සෝමවංශ සහෝදරයාඃ-* පළමු කොටම ජනාධිපතිවරයාත් ඔහුගේ ආණ්ඩුවත් යුද්ධය අවසාන වූ මොහොතේ අවබෝධ කරගත යුතු වූයේ යුද්ධය අවසාන වූ බවයි. යුද්ධය අතීතයට එක්වූ බවයි. 2009 මැයි මාසේ 19 වැනිදා යුද්ධය අවසන් වුණා. එනිසා 2009 මැයි මාසේ 20 වැනිදා සිට ජනාධිපතිවරයා සිය පූර්ණ අවධානය යොමු කළ යුතු වුණේ රට තුළ 'සාමය' ස්ථාපිත කළ යුත්තේ, කළ හැක්කේ කෙසේද යන්න ගැනයි. යුද්ධය

නැමැති පැරණි තැනින් සාමය නැමති අලුත් තැනට එන්න ජනතා විමුක්ති පෙරමුණ හැර අනික් එකම පක්ෂයක්වත් සමත් වුණේ නැහැ. ඒ නිසා තමයි අලුත් තත්වය තුළ ක්‍රියාත්මක කළ යුතු පියවර සහිතව ජනතා විමුක්ති පෙරමුණ 2009 මැයි 27 වැනිදා ''බෙදුම්වාදී ත්‍රස්තවාදය පැරදවීමෙන් පසු මවුබිම ඉදිරියේ ඇති හදිසි අභියෝග ජයගැනීම සඳහා වන ප්‍රායෝගික ප්‍රවේශයක්'' ඉදිරිපත් කළේ. මෙහි සඳහන් සමහර වගන්ති කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසුයි.

01. කොටි ත්‍රස්තවාදයෙන් මුදාගනු ලැබූ උතුරු හා නැගෙනහිර පළාත් කඩිනමින් ගොඩනැඟීම සඳහා සියලු ජනකොටස් සහභාගි කරගැනීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවල නියෝජිතයින්ගෙන් සමන්විත ''උතුරු හා නැගෙනහිර පළාත් යළි ගොඩනැගීමේ කාර්යය සාධක මණ්ඩලයක්'' පත්කළ යුතුයි.

02. උතුරු හා නැගෙනහිර පළාත්වල අවතැන් වූ ජනතාව යළි පදිංචි කිරීම සඳහා වූ ක්‍රමවත් වැඩපිළිවෙළක් වහාම ආරම්භ කළ යුතු අතර එම ක්‍රියාවලියෙන් අඩක්ම මෙම මාස තුනක කාලය තුළ සම්පූර්ණ කළ යුතුය.

04. කුරිරු ත්‍රස්තවාදී යුද්ධය නිසා ජීවිත අහිමි වූ සියලු පුරවැසියන්ගේ පවුල්වලට සාධාරණ වන්දි මුදලක් ලබාගැනීමට ඇති අයිතිය පිළිගත යුතු අතර මේ වන විටත් වන්දි මුදල් ලබා නොමැති සියලු පවුල් හඳුනාගෙන ඔවුන්ට වන්දි මුදල් ලබාදීම ආරම්භ කළ යුතුය.

07. විවිධ ජනකොටස්වලට සිදුව ඇති අසාධාරණයන් පිළිබඳ සොයාබැලීමත්, විවිධ ජනකොටස් අතර පවතින හිත් බිඳීම්, විරසකයන් තුරන් කිරීමත් අරමුණු කරගත් සත්‍යය හා ජාතික ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවිය යුතුය.

08. උතුරු හා නැගෙනහිර පළාත්වල බිඳවැටී ඇති නීතිය හා විධානයන්, සිවිල් පරිපාලනයත් යළි ස්ථාපිත කිරීම අරමුණු

කරගත් කඩිනම් වැඩපිළිවෙළක් දියත් කළ යුතු අතර ඊට සමගාමීව ඒ පළාත් දෙක තුළ අධිකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමද ආරම්භ කළ යුතුය.

එහි 7 වැනි වගන්තියේ සත්‍යය හා ජාතික ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවිය යුතුයයි සඳහන් වෙනවා. අද වගවීම පිළිබඳ ප්‍රශ්නය මානව අයිතීන් කවුන්සිලය ඉදිරියේ තිබෙනවා. 2009 දී යුද්ධය අවසානයේ වහාම මේ කොමිසම පිහිටුවීමට කටයුතු කළා නම් මානව හිමිකම් කවුන්සිලය ඉදිරියට ගෙනයාම සඳහා වගවීම පිළිබඳ ප්‍රශ්න ඉතිරිවන්නේ නැහැ.

මේ සමග තවත් වැදගත් දෙයක් තේරුම් ගත යුතුයි. මේ අසමත්කම කාගේ හරි පුද්ගලික නොහැකියාවක් නොවෙයි. ලංකාවේ පසුගාමී දුබල ධනපති ක්‍රමය තුළ ඒ ක්‍රමය පවත්වාගෙන යන දුර්වල පරාධීන ධනපති ආණ්ඩුවලට මෙවැනි සරල ප්‍රතිසංස්කරණ පවා කිරීමට නොහැකි බව ඔප්පු වෙමින් තිබීමක්. ලංකාවේ ධනවාදය තුළ ධනපති පාලකයන්ට බරපතළ සමාජ ප්‍රශ්න විසඳීම තබා ඉතාම සරල ප්‍රතිසංස්කරණ කිහිපයක් ඉටුකිරීමටවත් හැකියාවක් නැහැ කියන කරුණයත් ඒ සඳහා උවමනාවක් හෝ නැත කියන කාරණයත් මින් තහවුරු වෙනවා.

***12. ප්‍රශ්නයඃ- යුද්ධය අවසන්වී නව දේශපාලන තත්වයක් ඇතිවීමේ සිට ජිනීවා යෝජනා දක්වා ගමන්මග ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?***

***ටිල්වින් සහෝදරයාඃ-*** වසර 30ක පමණ කාලයක් පැවති බෙදුම්වාදී යුද්ධය අවසන්වුණේ අධිරාජ්‍යවාදීන්ට වාසිදායක ලෙස නොවේ. අනෙක් අතට උතුරේ යුද්ධය අවසන්වූ වහාම යුද්දෙන් පීඩාවට පත්වූ ජනතාවගේ හදිසි ගැටළු විසඳීමට, මානව හිමිකම් රැකීමට තම සූදානම පෙන්වනවා වෙනුවට ආණ්ඩුව කළේ යුද ජයග්‍රහණය තම දේශපාලන වාසි සඳහා යොදාගැනීම හා ජයග්‍රාහී උන්මාදයකින් කටයුතු කිරීමයි. ඉන් දෙමළ ජනතාව මානසිකව රිදවීමටත් ලක්කළා. මේ වටපිටාව තුළ යුද්ධය නිමාවීමත් සමග ඒවන විට ජිනීවාවල පැවැත්වෙමින්

තිබූ මානව හිමිකම් කොමිසමේ සැසියට ලංකාවට එරෙහි යෝජනාවකත් ගෙන ඒමට අධිරාජ්‍යවාදීන් වහාම සූදානම් වුණා. එහෙත් එහිදී ලංකාවට මිතුරු රටවල් කිහිපයක උපදෙස් මත ලංකාවට එරෙහි යෝජනාව වැළැක්වීම සඳහා ලංකාව විසින්ම මානව හිමිකම් කවුන්සිලයට යෝජනාවක් ඉදිරිපත්කරනු ලැබුවා. එය ඉදිරිපත්කොට සම්මතකර ගත්තේ 2009 මැයි 22වනදායි. මෙම යෝජනාවේ ශීර්ෂ පාඨය වුණේ ''මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාවට සහයවීම'' (assistance to sri lanka in the promotion and protection of human rights) යන්නයි. ප්‍රධාන කරුණු 5කින් සමන්විත එම යෝජනාව මගින් ලංකාවේ ආණ්ඩුව,

1. ගැටුම් අවසන්වූ පසු මානව හිමිකම්වලට ප්‍රමුඛත්වය ලබාදීමට අවතැන්වූවන්ද ඇතුළු ගැටුම්වලින් පීඩාවට පත්වූවන්ට අවශ්‍ය සහන ලබා දීමට හා පුනරුත්තාපනය කිරීමට,

2. නිතිපතා විනිවිද භාවය සහිතව පසුබිමේ තත්වය හා ගන්නා ලද පියවර පිළිබඳව මානව හිමිකම් කොමිසම දැනුවත් කිරීමට,

3. පීඩාවට පත්වූවන්ට සහන සැලසීමට ලංකා ආණ්ඩුව අදාල එක්සත් ජාතින්ගේ ආයතන හා මානව හිමිකම් සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීමට.

4. අවතැන්වූවන්ගේ අත්‍යාවශ්‍ය ගැටලු විසඳීමට හා,

5. ලංකාවේ ජනාධිපතිවරයා විසින් එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාට ලංකාවේ සංචාරයක් සඳහා කළ ආරාධනාව යළිත් තහවුරු කිරීමට,

මානව හිමිකම් කොමිසමට එකඟවුණා.

ඒත් සමගම 2009 මැයි 23වනදා එක්සත් ජාතීන්ගේ ලේකම් බැන් කි මූන්ගේ ලංකා සංචාරය සිදුවුණා. එය අවසානයේ එදිනම ලංකාවේ ආණ්ඩුව හා බැන්කි මූන් ඒකාබද්ධ ප්‍රකාශයක්ද නිකුත් කළා. මානව අයිතීන් පිළිබඳව ජාත්‍යන්තර තත්වයට අනුකූලව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් රැකීමට හා

ප්‍රවර්ධනය කිරීමට සිය දැඩි කැපවීම පෙන්වන බව ලංකාව පැවසූ බවත් ජාත්‍යන්තර මානවහිමිකම් නීති උල්ලංඝනය වීම් පිළිබඳ වගවීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවය එක්සත් ජාතීන්ගේ ලේකම්වරයා පෙන්වා දුන් බවත් ආණ්ඩුව එම ගැටලු විසඳීමට පියවර ගන්නා බවත් එකී ප්‍රකාශය මගින් සහතික වුණා. එහෙත් ආණ්ඩුව භාවිතාවේදී මේ කිසිවක් සැලකිල්ලට ලක් කළේවත් ඉටුකළේ වත් නැහැ. ඒ වෙනුවට සියලු දෙනා රවටමින් දවස ගෙවාගැනීමේ දේශපාලනයේ නියැළුණා.

මෙම තත්වය යොදාගත් බැන්කි මූන් මහතා 2010 මාර්තු 10වෙනිදා නිව්යෝර්ක්වල පුවත්පත් සාකච්ඡාවක් පවත්වමින් ලංකාව පිළිබඳ තමන්ට උපදෙස් දීම සඳහා උපදේශක මණ්ඩලයක් පත්කරන බව පවසා සිටියා. එසේම ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය ලේකම් ලියොන් ෆැස්කෝ ලංකාවට එවන බවත් ඊට ලංකාවේ ජනාධිපතිවරයා එකඟවී ඇති බවත් පැවසුවා.

මෙහිදීත් ආණ්ඩුව කළේ මතුවෙමින් එන අනතුර වටහාගෙන කටයුතු කිරීම වෙනුවට මෙම තත්වය රට තුළ තම ප්‍රතිරූපය නංවාගැනීමටත් ජනතාව නොමග යැවීමටත් යොදාගැනීමයි. ඒ අනුව රටතුළ බොරු බැන්කි මූන් විරෝධයක් නිර්මාණය කළා. ඒ අතර ජනාධිපතිවරයා විසින් 2010 මැයි 15වනදා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පත්කළා. ඒ යුද්ධය පැවති අවසන් කාලයේ මානව හිමිකම් කඩවීම් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහායි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමත් අධිරාජ්‍යවාදීනුත් උනන්දුවූයේද එල්.එල්.ආර්.සී. කොමිසමට පැවරුණේද යුද්ධය පැවති සමස්ත කාලය පිළිබඳ පරීක්ෂණයක් කිරීම නොව යුද්ධය අවසන්වූ ආසන්න මාසය කිහිපය තුළ සිදුවූ සිදුවීම් ගැන පමණක් පරීක්ෂා කිරීමයි. දරුස්මාන් කමිටුව තම වාර්තාව සකස් කිරීමට යොගත්තේ 2008 සැප්තැම්බර් සිට 2009 මැයි 19 දක්වා කාලය පමණක් වීමෙන් මෙය පැහැදිලි වෙනවා. මෙලෙස මෙම පරීක්ෂණ

සීමිත කාලයකට පමණක් සීමා කිරීමද වැරැද්දක් නමුත් ආණ්ඩුව එලෙස කටයුතු කළා.

මේ අතර 2010 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල අයවැය පැවති කාලයේ බැන්කි මූන්ගේ කමිටුවට එරෙහිව ආණ්ඩුව රට තුළ උද්ඝෝෂණ සංවිධානය කළා. මාරාන්තික උපවාසයන්ද ආරම්භ කළා. ඒ ජනතා අවධානය අයවැය වෙතට නොයවා බොරු අධිරාජ්‍යවිරෝධයක් වෙත ඇදගැනීම සඳහායි. ලංකාව තුළ බැන්කි මූන් විරෝධයක් පවත්වද්දී ඒ අතරම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලංකාවේ නිත්‍ය නියෝජිත පාලිත කොහොන මහතා බැන්කි මූන්ගේ කමිටුවේ සභාපති දරුස්මාන්ට ලිපි ලියමින් ඔවුන්ට දිවා භෝජන සංග්‍රහයක් පවා පිරිනමා ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කළා.

මේ අතර 2011 අප්‍රේල් 12 වෙනිදා දරුස්මාන් වාර්තාව බැන්කි මූන් මහතාට බාරදුන් අතර ඔහු එය අප්‍රේල් 26 වනදා එක්සත් ජාතීන්ගේ සංවිධානයට බාරදුන්නා. මේ මුළු කාලය පුරාම ආණ්ඩුව රට තුළ පැතිරවූ මතය වූයේ බැන් කිමූන්ලාගේ අරමුණ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විදුලි පුටුවේ තැබීම බවත් ඔහු ඉන් බේරාගත යුතු බවත්ය. මේ සඳහා ජනාධිපතිවරයාට ජනතාවගේ පක්ෂපාතීත්වය පෙන්විය යුතුයැයි කියමින් ඒ මගින් ජනතාව බියට පත්කරමින් මැතිවරණවලදී (පළාත්පාලන) ඡන්ද ගැනීමට එය යොදා ගත්තා. ඒත් දරුස්මාන් වාර්තාවේ 'වගවීම' නැමති අනුමාතෘකාව සහිත කොටසේ සඳහන්වී තිබුණේ මෙසේයි. ''මෙම චෝදනා ඔප්පු කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා හමුදා නායකයින්ද රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද එල්ටීටීයේ හමුදා හා සිවිල් නායකයින්ද ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් වග කිව යුතු වෙනු ඇත.''

මේ අනුව ජනාධිපතිවරයා හෝ කිසිදු දේශපාලන නායකයෙක් මෙහිදී ඉලක්කවී තිබුණේ නැහැ. එහෙත් අධිරාජ්‍යවාදීන් රටට එරෙහි මැදිහත්වීම් පියවරෙන් පියවර ක්‍රියාවට නගමින් තිබුණා. ඒ අතර කිහිප වරක්ම එක්සත්

ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ඒමටද උත්සාහ කළා. එහෙත් විවිධ හේතු නිසා එය සිදුවූයේ නැහැ. ඒ නිසා රාජපක්ෂ පාලනය දිගටම හිතුවක්කාරී ලෙස බොරු කියමින් මානව හිමිකම් ආරක්ෂා නොකරමින් හා කඩ කරමින් දිය රත්වන තුරු සැළියේ කෙළින කකුළුවන් සේ කටයුතු කරමින් සිටියා.

මේ අතර උගත් පාඩම් කොමිසම තම පරීක්ෂන අවසන් කොට එහි වාර්තාව 2011 නොවැම්බර් 20 වෙනිදා ජනාධිපතිවරයාට බාරදුන්නා. එය බාරගත් ජනාධිපතිවරයා විශාල ජයග්‍රහණයක් ලද කෙනෙක් මෙන් එය සතුටින් බලන පින්තූරයක්ද ඒ දිනවල පුවත්පත්වල පළ කළා. එල්.එල්.ආර්.සී වාර්තාව නිකුත්වීමත් සමග අධිරාජ්‍යවාදීන් දරුස්මාන් වාර්තාව පසෙකලා එල්.එල්.ආර්.සී වාර්තාව වහාම එළි දක්වන ලෙස ආණ්ඩුවට බල කළා. අයවැය අවසානයේ මෙය පාර්ලිමේන්තුවට ජනාධිපතිවරයා විසින්ම ඉදිරිපත් කිරීමට කළින් සැලසුම් කරගෙන සිටියත් විදේශ රටවල බලපෑම් නිසාත් අය වැය හිඟය පියවා ගැනීමට ඔවුන්ගෙන් ණය ගැනීමේ වුවමනාව නිසාත් අයවැය අතර තුර 2011 දෙසැම්බර් 16 නිමල් සිරිපාල ඇමතිවරයා විසින් එල්.එල්.ආර්.සී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරනු ලැබුවා. එහිදී මෙම වාර්තාව අගය කළ ඔහු එහි නිර්දේශ ක්‍රියාවට නැගීමට සියලුම පක්ෂවල සහයද ඉල්ලා සිටියා.

පසුව සිදුවූ සිදුවීම්වලට අනුව හා දැන් ආණ්ඩුවම කියන කතාවලට අනුව පෙනෙන්නේ, මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විටත් ජනාධිපතිවරයා හෝ ආණ්ඩුවේ ප්‍රධානීන් එය සම්පූර්ණයෙන් කියවා හෝ අවබෝධ කරගෙන නොතිබූ බවයි. කෙසේ වෙතත් මෙම වාර්තාව එළිදැක්වීමෙන් පසු අධිරාජ්‍යවාදීන් දුටුවේ එය තම අරමුණු හා හොඳින් ගැලපෙන බවයි. ඉන් පසු ඔවුන් එම වාර්තාවේ නිර්දේශ වහා ක්‍රියාත්මක කරන ලෙස බල කිරීමට පටන් ගත්තා. මෙහිදී ආණ්ඩුව සුපුරුදු ලෙස කල් ගනිමින් ප්‍රශ්නය මගහැර යා හැකි යැයි පැවසූ

එක්සත් ජනපදය පසුගිය 2012 පෙබරවාරි 27 ආරම්භ වූ මානව හිමිකම් කොමිසමේ 19වන සැසියට මේ පිළිබඳ යෝජනාවක් ගෙනෙන බව පැවසුවා. එම බරපතල අවස්ථාවේත් ආණ්ඩුව කටයුතු කළේ දෙබිඩි ලෙසයි. ඒ වන විට තෙල් මිල, බස් ගාස්තු හා විදුලි ගාස්තු වැඩිවීම විසින් හා සාමකාමී උද්ඝෝෂණවලට වෙඩිතබා ධීවරයෙක් මරා දැමීම විසින් නිර්මාණය වෙමින් තිබූ ආණ්ඩු විරෝධය වෙන අතකට හැරවීම සඳහා ආණ්ඩුව රට තුළ එක්සත් ජනපද යෝජනාවට එරෙහි උද්ඝෝෂණ ආරම්භ කළා. එහෙත් ජිනීවාවලදී එල්.එල්.ආර්.සී. වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන බවට පුන පුනා සහතික වුණා. ජිනීවා කොමිසම හමුවේ මහින්ද සමරසිංහ ඇමතිවරයා කළ කතාව තුළ අඩංගු වුණේ ආණ්ඩුව දැනටමත් එල්.එල්.ආර්.සී වාර්තාව් නිර්දේශ ක්‍රියාත්මක කරමින් සිටින නිසා ඒ පිළිබඳ යෝජනාවක් ගෙන ඒම අසාධාරණ බවයි. කෙසේ වෙතත් අවසානයේ එක්සත් ජනපදය මානව හිමිකම් කොමිසමට ලංකාව පිළිබඳ යෝජනාව ඉදිරිපත්කොට ඉන්දියාවේද සහය සහිතව සම්මත කරගත්තා. මේ ප්‍රශ්නයේදී ඉන්දියාවේ සහාය ලංකාවට ලැබෙන බවට ආණ්ඩුව ප්‍රචාරය කළත් ඉන්දියානු ආණ්ඩුව පෙළ ගැසී සිටින්නේ අධිරාජ්‍යවාදය සමග බව මෙහිදී නැවත තහවුරු වුණා. අවසානයේ ලංකාවේ ආණ්ඩුව තමන් විසින්ම පිහිටවූ එල්.එල්.ආර්.සී කොමිසමේ නිර්දේශ තුළ සිර කිරීමට අධිරාජ්‍යවාදීන් සමත්වුණා. ඒ මේ සමස්ත කාලය පුරා ආණ්ඩුව හැසිරුණු අඳබාල හා දෙබිඩි හැසිරීම නිසයි.

***13. ප්‍රශ්නයඃ- එම ජිනීවා යෝජනා රජය පිළිනොගැනීමත්, එක්සත් ජනපදයට එරෙහිව ආණ්ඩුව මැදිහත් වී උද්ඝෝෂණ පැවැත්වීමත් පෙන්නුම් කරන්නේ රාජපක්ෂ පාලනය අධිරාජ්‍ය විරෝධී බවද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** මහින්ද රාජපක්ෂ ධනපති පාලනය අධිරාජ්‍යගැති එකක්. ආණ්ඩුව ජිනීවා යෝජනා පාවිච්චි කර ගන්නෙ ජනතාව මුලා කරන්නයි. එහි අධිරාජ්‍යගැති බව වසං කරන්නයි, ජිනීවාහිදී ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයත් අභිමානයත් ආරක්ෂා කර ගන්න තරම් ආණ්ඩුව රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලදී විචක්ෂණ නොවුණ බව වසං කරන්නයි.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අධිරාජ්‍යවාදය ඔසවාගෙන සිටින කණු අතරින් වැදගත්ම එකක් වුණු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක හවුලේ ලාංකේය ජනතාව මත අසීමිත ආර්ථික බරක් පටවනවා. ඉදිරියේදී තවත් බර පටවන බව සහතිකයි. ඉතින් කොහොමද රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවිරෝධී වෙන්නෙ?

මේ රාජපක්ෂ පාලනය 2007 දී ඇමරිකා එක්සත් ජනපදය එක්ක යුද ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුම අනුව ඇමරිකා එක්සත් ජනපදයට යුද කටයුතු වලට අවශ්‍ය අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ මුහුද, වරායයන්, අහස ආදිය පාවිච්චි කරගන්න පුළුවන්. එතකොට කොහොමද රාපක්ෂ පාලනය අධිරාජ්‍යවිරෝධී වෙන්නෙ? ඒ විතරක් නෙවෙයි එක්සත් ජනපදය පැසිපික් කමාන්ඩ් කියන හමුදා ඒකකය විටෙන් විට ලංකාවට එනවා. ත්‍රිකුණාමලයට එනවා. ලංකාවේ විවිධ සුබසාධන වැඩවලට මැදිහත් වෙනවා. එය එක්සත් ජනපදයත් පිළිගෙන තිබෙනවා. ඒ වගේම ලංකාවේ ලිහිසිතෙල් බෙදාහැරීම තියෙන්නේ එක්සත් ජනපද සමාගමක් වන කැල්ටෙක්ස් සමාගම සතුවයි. එම සාමගම හා ලංකාව අතර තිබූ ගිවිසුම දෙවැනි වරට දික්කළේ රාජපක්ෂ ආණ්ඩුවයි. පොළොන්නරුවේ ඉඩම් අක්කර 5000ක් එක්සත් ජනපද ඩෝල් සමාගමට දීමට තීරණය කළෙත් මේ ආණ්ඩුවමයි. ඉතිං මේ ආණ්ඩුව අධිරාජ්‍ය විරෝධී හෝ එක්සත් ජනපද විරෝධී වෙන්නේ කොහොමද? ඒකසත් ජනපද බලපෑම් නිසා මේ ආණ්ඩුව ඉරානයෙන් ඩොලර්වලට බොරතෙල් ගැනීමත් නතර කළා. මේ නිසා ලංකාවේ තෙල් ගෙන්වීම හා බෙදාහැරීම මුළුමනින්ම ඉන්දියානු තෙල් සමාගම අතට පත්වීමේ අනතුර පවා මතුවෙලා තියෙනවා. අධිරාජ්‍යවාදය හමුවේ මේ ආණ්ඩුව ඇත්තටම රඟපාන්නේ ප්‍රවේණිදාස භූමිකාවක්. රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව මේ වෙනකොට දැවැන්ත විරෝධයක් අප්‍රසාදයක් ගොඩ නැගෙමින් තියෙනවා. මේ ජනතා විරෝධය වෙන පැත්තකට හරවන්න රාජපක්ෂ ආණ්ඩුව බොරු අධිරාජ්‍යවිරෝධයක් පෙන්වනවා.

***14 .ප්‍රශ්නයː- ජිනීවා යෝජනා මගින් අධිරාජ්‍යවාදයට ලංකාවට එරෙහිව ක්‍රියාත්මක විය හැක්කේ කෙසේද?***

***ටිල්වින් සහෝදරයාː-*** ජිනීවා යෝජනාවේ ප්‍රධාන කරුණු 3ක් තිබෙනව. එනම් ආණ්ඩුව LLRC වාර්තාවේ නිර්දේශ ක්‍රියාවට නැගිය යුතුයි. ඊළඟට එම නිර්දේශ ක්‍රියාවට නැගීම සඳහා මාර්ග සිතියමක් සකස් කළ යුතුයි. මෙහිදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසමේ හා අදාල ආයතනවල තාක්ෂණික සහය ලංකාවේ කැමැත්ත මත ලබාගත යුතුයි. ඒ අතර මානව හිමිකම් කොමිසමේ 22 වන සැසියට මෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මානව හිමිකම් කොමිසම විසින් ඉදිරිපත් කළ යුතුය යන්න එම කරුණුයි. දැන් මෙම යෝජනාව සම්මත වී ඇති නිසා මෙයට අනුව කටයුතු නොකළොත් එය එක්සත් ජනපදය සමඟ ප්‍රශ්නයක් නොව මානව හිමිකම් කොමිසම සමඟ ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ වගේම අවශ්‍ය නම් මෙය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ගෙන ගොස් ලංකාවට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට පවා ඉඩ සැලසෙනවා.

අනෙක් අතට LLRC වාර්තාවේ නිර්දේශවලට අනුව කෙරෙන පරීක්ෂණවලට ජිනීවා මානව හිමිකම් කොමිසමේ තාක්ෂණික සහාය ලබාගැනීමේ යෝජනාව මත අධිරාජ්‍යවාදීන්ට රට තුළට පැමිණ ක්‍රියාත්මක වීමට ඉඩ සලසනව. ඒ වගේම මෙම යෝජනාව හා සමගාමීව වෙනත් මානව හිමිකම් ප්‍රශ්න, පැහැර ගැනීම්ද උපයෝගීකරගෙන තව තවත් යෝජනා ගෙන එමින් ලංකාව වටලා ගැනීමට ඉඩ සැලසෙනවා. මෙම ක්‍රියාවලියේදී ඉන්දියාවද එක්සත් ජනපදය සමඟ එකට කටයුතු කිරීම නිසා තත්වය බරපතළ වීමේ ඉඩකඩක් තිබෙනවා. අවසානයේ රට යළි බෙදුම්වාදය ජයග්‍රහණය කරවීමේ දිශාවට තල්ලු කිරීමේ අනතුර ද තිබෙනව. ඒ නිසා රාජපක්ෂ ආණ්ඩුව වටහා ගැනීමට අසමත් වුණාට මෙම යෝජනාව සම්මත වීම ලංකාවට අනාගතයේ බරපතළ අනතුරුදායක තත්වයක් නිර්මාණය කරල තිබෙනවා.

***15. ප්‍රශ්නය:- ජිනීවා යෝජනාවලට පක්ෂ විපක්ෂ ලෙස දී තිබෙන බෙදුම් රේඛාව වැරදිනම් නිවැරදි බෙදුම් රේඛාව සකස් කළ යුත්තේ කෙසේද?***

*ටිල්වින් සහෝදරයා:-* බොහෝ ප්‍රශ්නවලදී වගේම මෙහිදීත් දෙපැත්තක් විතරක් නොවෙයි තිබෙන්නේ. ඒත් ධනපති ක්‍රමය ඇතුලෙ මිනිස්සුන්ට හිතන්න පුරුදු කරන්නෙ එහෙමයි. සමහර සංකීර්ණ ගැටලුවලට 'ඔව්' හෝ 'නැත' යනුවෙන් පිළිතුරු දිය නොහැකියි. ඒ වෙනුවට අදාල ගැටලුව පිළිබඳ විධිමත් විග්‍රහයක් සිදුකොට නිවැරදි ස්ථාවරයකට ආ යුතු වෙනවා. ජිනීවා යොජනාවල පෙනුම හා හරය අතර තිබෙන්නේ ලොකු වෙනසක්. ඒ නිසා එහි පෙනුමට රැවටිය යුතු නැහැ. හරය හා පෙනුම සමපාත වන්නේනම් විද්‍යාවක් අවශ්‍ය නැතැයි වරක් එංගල්ස් පවසා තිබෙන්නේද මේ අදහසයි.

ජිනීවා යෝජනාවේ පෙනුමේ තිබෙන්නේ මානව හිමිකම් රැකීම හා වගවීම සඳහා කරන මැදිහත්වීමකුයි. ඔවුන් ඉල්ලන්නේ එල්.එල්.ආර්.සී වාර්තාව ක්‍රියාවට නගන ලෙසයි. එහෙත් ඒ අතරම ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලෙස බලය බෙදන ලෙසද බලකරනවා. එක්සත් ජනපද යෝජනාවේ අඩංගු ප්‍රධාන කරුණු 3ට කළින් ඇති පැහැදිලි කිරීමේ ''පළාත්වලට බලය බෙදීමේ දේශපාලන විසඳුමක් වෙත ළඟාවීම'' යනුවෙන් වාක්‍යයක් සඳහන් වෙනවා. ඒ වගේම මෙම යෝජනාවට පක්ෂව ඡන්දය දීමෙන් පසු ඉන්දීය අගමැතිවරයා ලංකාවේ ජනාධිපතිවරයාට සිය ස්ථාවරය පැහැදිලි කරමින් එවූ ලිපියේද 13 ඉක්මවූ බලය බෙදීමක් ගැන සඳහන් කරනවා. ඒ වගේම එල්.එල්.ආර්.සී නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස යෝජනාව සම්මත කරද්දී එල්.එල්.ආර්.සී වාර්තාවේ නිර්දේශ තුළත් බලය බෙදිය යුතුය යන්න තිබෙනවා. ඒ අනුව යුද්ධය පවතිද්දී සන්නද්ධ ක්‍රියාකාරිත්වය තුළ ඉටුකර ගැනීමට නොහැකිවූ බෙදුම්වාදී දේශපාලන අරමුණ දැන් යුද්ධය අවසන්ව තිබියදී

මානව හිමිකම් මගින් ඉටුකර ගැනීමට මෙම බලවේග උත්සාහ දරමින් ඉන්නවා. ඒ කරුණු ගැන නොසලකා මානව හිමිකම් යෝජනාව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ නොහැකියි.

අනෙක් අතට එක්සත් ජනපදයට ලෝකයේ මානව හිමිකම් රැකීමේ සැබෑ වුවමනාවක් නැහැ. ඉන්දියාවටත් නැහැ. ලොව වඩාත්ම කුරිරු ලෙස මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ එක්සත් ජනපදයයි. ඉරාක යුද්ධයේදී, ඇෆ්ගනිස්තානයේදී, ලිබියාවේදී ඔවුන් අමු අමුවේ මානව අයිතීන් උල්ලංඝනය කළා. එපමණක් නොවෙයි ස්වාධීන රටවල ස්වාධීනත්වය හා ස්වෛරීභාවයත් උල්ලංඝණය කළා. පලස්තීන ජනයාගේ මානව හිමිකම් ඊශ්‍රායලය විසින් උල්ලංඝනය කරද්දී ඒ ගැන ඔවුන් කතාකරන්නෙ නැහැ. ඒ නිසා අධිරාජ්‍යවාදීන්ගේ මානව හිමිකම් පිළිබඳ කිඹුල් කඳුළු පැහැදිලිවම වංචාවක්. ඔවුන් 'මානව හිමිකම්' 'වගවීම' R2P වැනි සංකල්ප සිය අධිරාජ්‍යවාදී වුවමනාවන් වෙනුවෙන් අවිලෙස යොදාගන්නවා.

එහෙත් ඉන් අදහස් වෙන්නේ, එක්සත් ජනපද යෝජනාවට එරෙහිව මහින්ද රාජපක්ෂ සමග අත්වැල් බැඳගත යුතුය යන්න නෙවෙයි. මානව හිමිකම් දඩමීමා කරගෙන ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට අත පෙවීමට අධිරාජ්‍යවාදීන්ට අවස්ථාව හදලා දුන්නේ මේ ආණ්ඩුවයි. අඬන්න ඉන්න මිනිහගෙ ඇහැට ඇඟිල්ලෙන් අනිනවා වගේ කටයුතු කළේ වත්මන් ආණ්ඩුවයි. එපමණක් නොවෙයි. රාජපක්ෂ පාලනය සැබෑ ලෙසම මානව හිමිකම් උල්ලංඝනය කරන ජනතාව පීඩාවට පත්කරන ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරමින් හිතුවක්කාරී ලෙස කටයුතු කරන පාලනයක්. අධිරාජ්‍යවාදීන් සමග බොහෝ කරුණුවලදී අත්වැල් බැඳගත් පාලනයක්. ඒ නිසා රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවිරෝධී වෙන්නෙ නැහැ. අධිරාජ්‍යවිරෝධී අරගලයන් ඔවුන් සමග කරන්නත් බැහැ. මේ තත්වය මත ජනතාව බෙදුම් රේඛාව ඇඳගත යුත්තේ, අධිරාජ්‍යවාදයත් ඊට පාර කපන

ධනපති ආණ්ඩුවත් එක පැත්තක තියලයි. අධිරාජ්‍යවිරෝධී, ධනපති විරෝධී, ප්‍රගතිශීලී සැබෑ දේශප්‍රේමී බලවේග බෙදුම් රේඛාවේ අනික් පැත්තේ සිටිය යුතුයි. අධිරාජ්‍යවාදය සැබෑ ලෙසම පැරදවීමටනම් ඔවුන්ගේ දේශීය ඒජන්තයින් ලෙස කටයුතු කරන ධනපති ආණ්ඩුද පැරදවිය යුතුවෙනවා. අධිරාජ්‍යවාදයට එරෙහිව රාජපක්ෂ පාලනය සමග අත්වැල් බැඳගැනීම කියන්නේ වක්‍රාකාරයෙන් අධිරාජ්‍යවාදය සමග අත්වැල් බැඳ ගැනීමයි. රාජපක්ෂ ආණ්ඩුව ජිනීවා යෝජනාවට අකැමැති බව පෙන්නුවට අධිරාජ්‍යවිරෝධී පිලේ ඉන්න ඔවුන්ට බැහැ. ඒ අනුව තමයි ඉහත බෙදුම් රේඛාව ධනපති ආණ්ඩුවත් අධිරාජ්‍යවාදයත් එක් ගොඩක තබා සකස් කළ යුතු වෙන්නේ.

***16. ප්‍රශ්නයඃ- එසේනම් අධිරාජ්‍යවාදයට එරෙහිවීම ලෙස ඔබ දකින්නේ කුමක්ද ?***

***සෝමවංශ සහෝදරයා-ඃ*** අධිරාජ්‍යවාදය ආර්ථික, දේශපාලන - යුද හා සංස්කෘතික යන හැම ආකාරයකින්ම සෙසු රටවල් මත තම ආධිපත්‍යය ස්ථාපිත කරන්න උපාය-උපක්‍රම සකස් කර ක්‍රියාත්මක කරනවා.

අධිරාජ්‍යවිරෝධීන් අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික ආධිපත්‍යයට, දේශපාලන-යුද ආධිපත්‍යයට, සංස්කෘතික ආධිපත්‍යයට අභියෝග කළ යුතුයි. ඒවා පරාජය කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පෙළ ගැසිය යුතුයි. සටන්වැදිය යුතුයි. ජයග්‍රහණය කළ යුතුයි. අධිරාජ්‍යවාදය එහි හරයෙන්ම හඳුනාගෙන එය ක්‍රියාත්මක වන සෑම ක්ෂේත්‍රයක් තුළම එය පැරදවිය යුතුයි. ජිනීවා කොමිසම තුළ අධිරාජ්‍යවාදය දකින ආණ්ඩුවේ ඇමතිවරුන්ට අනෙක් සෑම ක්ෂේත්‍රයකම අධිරාජ්‍යවාදී සම්බන්ධය පේන්නේ නැත්තේ ඇයි යන ප්‍රශ්නය විමසා බැලිය යුතුයි. අධිරාජ්‍යවාදයෙන් යැපෙන හා ඊට පැවතීමට උදව් කරන එක් එක් රටවල ධනවාදය හා ධනපති ආණ්ඩු රකිමින් අධිරාජ්‍යවාදය පරදන්න බැහැ. අධිරාජ්‍යවාදය සැබැවින්ම පරදවන්න නම් ධනවාදයද පරාජය කළ හැකි සටනක් තුළ එය අන්තර්ගත විය යුතුයි.

*17. ප්‍රශ්නය:- රට තුළ මතයක් ගොඩනැගෙමින් තිබෙනවා, දැඩි පාලනයකට තමයි හැකියාව තිබෙන්නේ. අධිරාජ්‍යවාදයට මුහුණදී රට ආරක්ෂා කර ගන්න කියල. ඒ සඳහා සුදුසුම නායකයා ලෙස රාජපක්ෂ හඳුන්වනවා. ඒ පිළිබඳ ඔබගේ අදහස් කවරේද?*

*සෝමවංශ සහෝදරයා:-* අමූලික බොරු මතයක්. කාට එරෙහි දැඩි පාලනයක් ගැනද මේ කියන්නෙ? අධිරාජ්‍යවාදයට එරෙහිව දැඩි තැනක ඉන්නවානම් ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පස්සෙ දුවල ඒක එක්ක එකතුවෙලා ජනතාවට අසීමිත බර පටවයිද? ඇමරිකා එක්සත් ජනපදය එක්ක යුද ගිවිසුම්වලට අත්සන් කරාවිද? අධිරාජ්‍යවාදයේ ආශිර්වාදය, අනුබලය, අරමුදල් ලබන රාජ්‍ය නොවන සංවිධාන මගින් සංස්කෘතික ආක්‍රමණයට ඉඩ ලැබෙයිද?

එහෙනම් මේ කියන්නේ ජනතාවට එරෙහි රාජපක්‍ෂ පාලනයක් ගැනයි, දැඩි පාලනයක් ගැනයි.

ඒකාධිපතියන්ට රටවල් ආරක්ෂා කරන්න, රටක ස්වෛරීභාවය ආරක්ෂා කරන්න බැරි බව තමයි, ඉරාකයේදී, ලිබියාවේදී අපි දැක්කෙ. අධිරාජ්‍යවාදී හතුරාට එරෙහිව රටක මුළු මහත් ජනතාව ඒකරාශී කරන්න බලමුළු ගන්වන්න ඒකාධිපති පාලකයන්ට බැහැ. ඒක තමයි අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයා තම වාසියට හරවා ගන්නේ.

කියුබාව පුංචි රටක්. ඇමරිකා එක්සත් ජනපදයට කියුබාවේ ඉඳල දුර කිලෝමීටර් 150 යි. ඇමරිකාව කුලී හමුදා ලවා කියුබාව ආක්‍රමණය කළා. ඒත් පරාජය වී පසු බැස්සා. පුංචි කියුබාවට සිය ස්වෛරීභාවය, ස්වාධීනත්වය, අභිමානය රැකගන්න හැකි වුණා. ඒ, කියුබානු ජනතාව සිය අයිතීන් ආරක්ෂා කරන ආදරණීය නායකයන් වටා එකම බලවේගයක් ලෙස ඒකරාශී වී සිටින නිසයි.

*18. ප්‍රශ්නය:- යුද්ධය අවසන් මොහොතේදී රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවාදයට විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයට අනුව*

***ක්‍රියා නොකිරීම නිසා පළිගැනීමක් ලෙස රාපක්ෂ ආණ්ඩුවට ජිනීවා යෝජනා මගින් කෙනෙහිළිකම් කරන බවයි ආණ්ඩුව කියන්නේ. එහි සත්‍ය අසත්‍යතාවය කවරේද?***

*ටිල්වින් සහෝදරයා:-* පරිධියේ පසුගාමී රටවල ආණ්ඩු මේ යුගයේ පවතින්නේ, අධිරාජ්‍යවාදීන් සමග අත්වැල් බඳගෙන ඔවුන්ගෙන් යැපෙමිනුයි. එසේ වුවත් සමහර ප්‍රශ්නවලදී මේ පාර්ශව දෙක අතර කුඩා කුඩා වෙනස්කම් හා ප්‍රතිවිරෝධයනුත් මතුවෙනවා. අධිරාජ්‍යවාදය හා එක් එක් රටවල ධනපති ආණ්ඩු අතර යම් ප්‍රතිවිරෝධයක් තිබුණත් එය මූලික හෝ සතුරු ප්‍රතිවිරෝධයක් නොවෙයි. පන්ති අර්ථයෙන් මේ හැම දෙනාම ඉන්නේ එක අරමුණක. එක පෙරමුණක. ලෝක දේශපාලනයේ ජාත්‍යන්තර සම්බන්ධතාවල දයලෙක්තිකය පවතින්නේ එහෙමයි. යුද්ධය පවතිද්දී එක අතකින් එය තම වුවමනාවට අනුව කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන අතර අධිරාජ්‍යවාදී සමහර රටවල් හා ඉන්දියාව ලංකාවේ ආණ්ඩුවට විටින් විට යුදමය ආධාරත් කළා. යුද්ධය අවසන් මොහොතේදීත් ලංකාවේ ආණ්ඩුව එක්සත් ජනපදය හා ඉන්දියාවේ ඉල්ලීමට අනුව සමහර ක්‍රියාමාර්ග ගනිමිනුත් තිබුණා. එහෙත් යුද්ධය ඇවිලී තිබූ ආකාරය අනුව අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය ලෙසම එය හසුරුවාගැනීමේ අපහසුකමත් තිබුණා. යුද්ධය තුළ ක්‍රියාත්මකවූ විවිධ සාධක හා සමහර අහම්බීය සිදුවීම්ද නිසා එක්සත් ජනපදය හා ඉන්දියාව බලාපොරොත්තු නොවූ ලෙස යුද්ධය නිමාවුණා. ඒ පිළිබඳ කිසියම් මදිපුංචිකමක් එම රටවලට තිබිය හැකියි. ඒහෙත් එය ප්‍රධාන කාරණය නොවෙයි. එය ප්‍රධාන කරුණක් ලෙස සැලකුවහොත් සත්‍යය වැසී යනවා. මෙම රටවලට ලංකාව සම්බන්ධයෙන් උපායමාර්ගයක් තිබෙනවා. ඒ ලංකාව බෙදුණු දුර්වල රාජ්‍යයන් දෙකක් බවට පත් කිරීමයි. නැතිනම් ලංකාවේ ආණ්ඩුව එක්සත් ජනපද රූකඩයක් ලෙස දිගටම පවත්වා ගැනීමයි. එය බෙදුම්වාදී යුද්ධය මගින් ඉටුකර ගැනීමට ඔවුන් උත්සාහ කළා. දැන් යුද්ධය අවසන්වූ විටත් ඔවුන් සිය උපාය මාර්ගය අත්හරින්නේ නැහැ. ඒ වෙනුවට ඔවුන් මානව

හිමිකම් හා වගවීම නැමති සංකල්ප මගින් එය ඉටුකර ගැනීමට උත්සාහ දරනවා. ඒ සඳහා ''දඩමීමා'' ලෙස මානව හිමිකම් යොදාගන්නවා. ලංකාවේ ආණ්ඩුව අධිරාජ්‍යවාදී උගුලක හසුවුණේ ඒ මගින්යි. ඒ නිසා අධිරාජ්‍යවාදයේත් ඉන්දියානු ආධිපත්‍යවාදයේත් ලංකාව පිළිබඳ මැදිහත්වීම සරල කරුණු නිසා සිදුවන දෙයක් නොවෙයි. එය ඔවුන්ගේ භූ දේශපාලන වුවමනාවන්ගේ උපායමාර්ගයට අනුව සිදුවන දෙයක්. අප ඉඩ නොතැබිය යුත්තේ ඔවුන්ට ඒ සඳහා සාධාරණ හේතු සොයාගැනීමටයි. රාජපක්ෂ ආණ්ඩුව කළ බරපතල වැරැද්ද ඔවුන්ට සාධාරණ ලෙස පෙනෙන එම හේතු සපයා දීමයි.

***19. ප්‍රශ්නයː- එසේනම් අධිරාජ්‍යවාදී මැදිහත්වීමෙන් මිදීම සඳහා ජනතාව ගතයුතු මග කවරේද? ඒ සඳහා ඔබ ඉදිරිපත් කරනු ලබන යෝජනා කවරේද?***

***සෝමවංශ සහෝදරයාː-*** අධිරාජ්‍යවාදී මැදිහත්වීමෙන් මිදීම සඳහා අධිරාජ්‍යවිරෝධී අරගලයක් දියත් කිරීමේ හා එය ජයග්‍රහණය කරවීමේ අත්‍යවශ්‍යතාවය දැන් වෙන කවරදාටත් වඩා ඉස්මතුවී තිබෙනවා.

මේ සඳහා අධිරාජ්‍යවාදයෙන් බැටකන සමාජයේ සියලු කොටස් අධිරාජ්‍යවිරෝධී පෙරමුණක් තුළ ඒකරාශී කළ යුතුයි. ඒ තුළ සියලු ප්‍රගතිශීලීන්, ප්‍රජාතන්ත්‍රවාදීන්, මානව හිතවාදීන්, පරිසර හිතවාදීන් ඒකරාශී කළ යුතුයි. කම්කරු, ගොවි, ධීවර, තරුණ, ශිෂ්‍ය හා තාක්ෂණවේදීන් වෘත්තීයවේදීන්, බුද්ධිමතුන්, පූජ්‍ය පූජක පක්ෂය, මාධ්‍යවේදීන්, සාහිත්‍ය කලා සූරීන් යන සියලු ස්ථරවලට අයිති රටට ජනතාවට ආදරය කරන බහුතර ජනතාව ඒකරාශී කළ යුතුයි. ඒකරාශී කර සටන්වැදිය යුතුයි.

***20. ප්‍රශ්නයː- මෙම අධිරාජ්‍යවාදයට එරෙහි පෙරමුණ ධනපති පන්තිය සමග ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක්ද?***

***සෝමවංශ සහෝදරයාː-*** කිසිසේත්ම නැහැ. ධනපති පන්තියට අධිරාජ්‍යවාදයේ ආශිර්වාදය, සරණ, පූර්ණ සහය නැතුව එක මොහොතක්වත් පවතින්න හැකියාවක් නැහැ. සැබෑ

අධිරාජ්‍යවිරෝධී, පළල්ම සංවිධානයක් තුළ අධිරාජ්‍යගැති රාජපක්ෂ ඇතුළු හවුලට අධිරාජ්‍යගැති ධනපති එක්සත් ජාතික පක්ෂයේ කැලි දෙකටම හෝ ධනපති දෙමළ ජාතික සන්ධානයට හෝ කිසිදු ඉඩක් නැහැ. මෙහිදී ධනපති පන්තිය සමග කිසිදු ඒකාබද්ධ ක්‍රියාමාර්ගයකට ඉඩක් නැහැ.

***21. ප්‍රශ්නයː- යෝජිත අධිරාජ්‍යවිරෝධී පෙරමුණ පසුව ශක්තිමත් ධනපති පාලනයකට පාර කැපීමක්ද?***

***ටිල්වින් සහෝදරයාː-*** කිසිසේත්ම නැහැ. මෙය සන්ධාන දේශපාලනයක් හෝ පන්ති සහයෝගීතා වාදී එක්සත් පෙරමුණක් හෝ නොවෙයි. වමේ ව්‍යාපාරයේ නායකත්වයෙන් සියලු අධිරාජ්‍යවිරෝධීන් සැබෑ දේශප්‍රේමීන් හා ප්‍රගතිශීලීන් එක මධ්‍යස්ථානයකට එකතු කිරීමක්. එය ජාත්‍යන්තර තලයේ අධිරාජ්‍යවාදයට එරෙහිව කරන අරගලයේදී පළමු පියවර වන්නේ දේශීය වශයෙන් ධනවාදය පැරදවීමයි. ඒ නිසා මෙය ධනවාදය පරදවන අධිරාජ්‍යවාදයට මුහුණදිය හැකි ශක්තිමත් ජනතා පදනමක් සහිත සැබෑ අධිරාජ්‍යවිරෝධී ධනේශ්වරවිරෝධී, සමාජවාදී, පාලනයකට මග විවරකිරීමක්. කිසිසේත්ම ශක්තිමත් හෝ දුර්වල ධනපති පාලනයකට යළි මග විවර කිරීමක් නොවේ.

***22. ප්‍රශ්නයː- අප වැනි රටක සමාජය තීව්‍ර ලෙස දේශපාලන පක්ෂවලට බෙදී පවතින තත්වයක් තුළ එය ඉක්මවා යන පෙරමුණක් ගොඩනගන්නේ කෙසේද?***

***ටිල්වින් සහෝදරයාː-*** මෙය බැලූ බැල්මට ගැටලුවක් සේ පෙනෙන්න පුළුවන්. ඊට එක් හේතුවක් වන්නේ, ලංකාවේ මෙතෙක් බිහිවූ සියලු පෙරමුණු හා සන්ධාන, දේශපාලන පක්ෂවල නායකයින් එකතුවී නිර්මාණය කළ ඒවා වීමයි. ඒත් වත්මන් තත්වය තුළ විවිධ දේශපාලන පක්ෂ ක්‍රියාත්මක වෙමින් ඇති ආකාරය අනුව හා ඒ ඒ දේශපාලන පක්ෂවල වෙනස් පන්ති වුවමනාවන් අනුව දේශපාලන පක්ෂවල එකතුවකින් ස්ථාවර උපායමාර්ගික සැබෑ අධිරාජ්‍යවිරෝධී

පෙරමුණක් ගොඩනැගීම දුෂ්කරයි. දේශපාලන පක්ෂ සමග ගොඩනැගිය හැක්කේ කිසියම් නිශ්චිත කරුණක් වෙනුවෙන් උපක්‍රමික එකතුන් පමණයි. එයද පවතින තත්වයට අනුව සලකා බැලිය යුතුයි. එහෙත් අධිරාජ්‍යවිරෝධී හා ධනපතිවිරෝධී පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමේදී එය ගොඩ නගන්නේ උපායමාර්ගිකව හා සමාජ පරිවර්තනයක් ඉලක්ක කරගෙන නම් එයට විවිධ වර්ගයේ පන්ති වුවමනා සහිත දේශපාලන පක්ෂ එකතුකිරීම කළ නොහැකි වනවා.

අප සැබෑ ලෙසම නිර්මාණය කළ යුත්තේ ඉහළින් නායකයන්ගේ එකතුවක් නොව පහළ සිට ජනතා බලවේග යන්ගේ එකතුවකුයි. ඊට වමේ ව්‍යාපාරය මූලිකත්වය ගතයුතුයි. වමේ නායකත්වය වටා සැබෑ අධිරාජ්‍යවිරෝධී දේශප්‍රේමී, ප්‍රගතිශීලී, බලවේග කණ්ඩායම් හා පුද්ගලයන් ඒකරාශි කරමින් සැබෑ ජනතා ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුයි. මන්ද සැබෑ ලෙසම අධිරාජ්‍යවාදය පැරදවීමේ හැකියාව ඒ සඳහා වන වුවමනාව හා ශක්තියත් තිබෙන්නේ, ජනතාව සතුව නිසයි.

ඒ අනුව වැඩකරන ජනතාව ගොවි ජනතාව, ධීවර ජනයා සමාජයේ විවිධ ස්ථර වන උගතුන්, මාධ්‍යවේදීන්, කලාකරුවන් අතර සිටින සැබෑ අධිරාජ්‍යවිරෝධී පුද්ගලයන්, සමාජ ක්‍රියාකාරීන් ස්වේච්ඡා සංවිධාන හා ඔවුන්ගේ බලපෑම තුළ එකතුවන පොදු ජනතාවන් මෙවැනි අධිරාජ්‍යවිරෝධී ව්‍යාපාරයක බලවේග බවට පත්වෙනවා. මෙය බැලූ බැල්මට ප්‍රායෝගික නොවන සේ පෙනුනත් දනට වඩාත් ප්‍රායෝගික හා නිවැරදි වන්නේ මෙයයි. එය ක්‍රියාවට නැගීම අපේ වගකීමයි.

***23. ප්‍රශ්නයඃ- අධිරාජ්‍යවාදී මැදිහත්වීම පරාජයට පත්කිරීම සඳහා සාර්ථක දේශපාලන ක්‍රියාමාර්ග ගනු ලැබූ රටවල් තියෙනවාද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** ඔව්, වියට්නාමය මේ පිළිබඳව කදිම උදාහරණයක්. කොමියුනිස්ට්වාදීන්ගේ ඉඳල බෞද්ධ භික්ෂූන් වහන්සේලා දක්වා සමාජයේ සියලු ස්ථර අධිරාජ්‍යවිරෝධී පෙරමුණ තුළ ඒකරාශී වී බොහෝ පෙරමුණු තුළ සටන්

වැදුණා. 1975දී ජයගත්තා. ඒ වගේම 1979 දී ජයග්‍රහණයෙන් කෙළවර වුණු නිකරගුවා සටනේදීත් කොමියුනිස්ට්වාදීන්ගේ සිට කතෝලික පල්ලියේ පූජකවරු දක්වා සියලු කොටස් ඒකරාශී වී සිටියා. 1959 ජයග්‍රහණය කළ කියුබානු විප්ලවයේදී ජූලි 26 ව්‍යාපාරය තුළත් විවිධ ජනකොටස් ඒකරාශීව සිටියා. වර්තමානයේදී වෙනිසියුලා, බොලීවියා යන රටවල් තුළ අධිරාජ්‍යවිරෝධී පෙරමුණු අධිරාජ්‍යවාදයට එරෙහිව ජයග්‍රාහී ලෙස සටන් කරමින් ඉදිරියට යමින් සිටිනවා.

***24. ප්‍රශ්නයඃ- මෙයට විසඳුම් ලෙස ඔබ අධිරාජ්‍යවිරෝධී වැඩපිළිවෙළක් යෝජනා කරනවා. එම වැඩපිළිවෙළ කුමක්ද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** අධිරාජ්‍යවාදයේ වර්තමාන ප්‍රකාශනය තමයි 70 දශකයේ ඉඳල මේ දක්වා ඇවිත් තියෙන නව ලිබරල් ධනවාදය. තවත් විදිහකට කියනවා නම් විවෘත වෙළඳපොළ ධනවාදය. මේ තමයි අධිරාජ්‍යවාදයේ ඒ කියන්නේ ධනවාදයේ ඉහළම අවධියේ කෲරතම හා අවසාන අදියර. මිනිස් වර්ගයා මෙතෙක් ආ ගමනේදී අත්පත් කරගත්ත සමස්ත වටිනාකම්, සමස්ත ජයග්‍රහණ, සමස්ත දැනුම මිනුම අද ලෝකයේ වෙසෙන කෝටි 700ක් වූ මුළු ජනගහනයට මූලික අවශ්‍යතා සියල්ල ඇති පමණින් සපයන්න හොඳටම ප්‍රමාණවත්. නමුත් අධිරාජ්‍යවාදයේ එහි අවසාන අදියර තුළ ලෝකයේ මිනිසුන් අතරින් අතිමහත් බහුතරයට (99%ට) එකී මූලික මිනිස් අවශ්‍යතා අහිමි කරලා. ලෝකයේ මිනිසුන් කීප දෙනෙකු (1%) ප්‍රකෝටිපතියන් කරලා. රටවල් අතර ඇති නැති පරතරය අසීමිත ලෙස වැඩි කරලා. ඒ වගේම රටවල් තුළත් ඇති නැති පරතරය දැවැන්ත ලෙස වැඩිකරලා.

ශ්‍රී ලංකාවත් ඒ වගේම රටක්. නව ලිබරල් ධනවාදය තුළ ආර්ථික, දේශපාලන, සමාජ, සදාචාර ප්‍රශ්න උග්‍රවෙලා. ජනතාවට අයිතීන් අහිමි කරලා.

ඒනිසා මේ අධිරාජ්‍යගැති ධනපති පාලනය පෙරළා දමා සමාජ සාධාරණයත් ප්‍රජාතන්ත්‍රවාදයත් ස්ථාපිත කරන යුක්තිග

රැක, සාධාරණ පාලනයක් පිහිටුවා ලාංකේය ජනතාව මේ මොහොතේ මුහුණ දී සිටින උග්‍ර ආර්ථික දේශපාලන සමාජ, සදාචාර ප්‍රශ්න සියල්ලටම විසඳුම් ලබාගත යුතුයි. ඒ අනුව අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක වැඩපිළිවෙළ සංයුක්ත වෙන්නේ සියලුම ක්ෂේත්‍රවල අධිරාජ්‍යවාදී බලපෑම් පරාජයට පත්කිරීම, ලොව පුරා අධිරාජ්‍යවිරෝධීන් සමග ඒ වෙනුවෙන් අත්වැල් බැඳගැනීම, එසේම අධිරාජ්‍යවිරෝධී අරගලය මගින්ම එහි දේශීය ඒජන්තයා වන ධනපති ආණ්ඩුව පරදා ධනපති ක්‍රමය වෙනස්කර සමාජවාදී පාලනයක් ගොඩනැගීම, ඒ තුළ සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය ගොඩනැගීම, ආර්ථික සංවර්ධනය සඳහා ජනතා ආර්ථිකයක් ගොඩනැගීම මහා ජනතා පාලනයක් ජනතා බලයක් ගොඩනැගීමයි.

***25. ප්‍රශ්නයः- ජ.වි.පෙ. මැදිහත්වී මීට පෙරද අධිරාජ්‍යවිරෝධී දේශපාලන ක්‍රියාවල නිරතවූවා. නමුත් එහි අවසන් ප්‍රතිඵලය වුණේ ස්ථාවර ධනපති ආණ්ඩුවක් ගොඩනැගීම නේද? ඉන් මෙම පෙරමුණ වෙනස් වන්නේ කෙසේද?***

*ටිල්වින් සහෝදරයාः-* පැහැදිලිවම 2004 අප සම්බන්ධවී ගොඩනැගූ සන්ධානය උපක්‍රමික අරමුණකින් ගොඩනැගුවක් මිස උපායමාර්ගික පෙරමුණක් නොවේ. ඒ මොහොතේ සටන් විරාම ගිවිසුම හා රිගේනින් ශ්‍රී ලංකා මගින් මතුවුණු අනතුරුදායක තත්වය අපට එම උපක්‍රමය ගැනීමට බල කළා. රට බෙදීම හා එමගින් පන්තිය බෙදීම වළක්වාලීම සඳහා තාවකාලික හා උපක්‍රමික සන්ධානයක් ගොඩනැගීමයි අප කළේ. ඒ නිසාම තමයි, අප ඉතා ඉක්මනින් ඉන් ඉවත්වුණෙත්. එම ක්‍රියාමාර්ගය නිසා බෙදුම්වාදය ජයගැනීමේ දිශාවට වේගයෙන් ගිය දේශපාලන ගමන වෙනස් වුණා. එය රටේත් ජනතාවගේත් ජයග්‍රහණයක්. නමුත් ඒ අතරම ඒ මගින් ගොඩනැගුනු ධනපති ආණ්ඩුව තාවකාලිකව හෝ ශක්තිමත් වුණා. සමහර උපක්‍රමවලදී වාසි වගේම අවාසිත් තියෙනවා. කෙසේ වුවත් එම උපක්‍රමික ක්‍රියාමාර්ග තුළ අපේ පැත්තෙන් හඳුනාගත යුතු න්‍යායික දේශපාලන අඩුපාඩු අප හඳුනාගෙන තිබෙනවා. ඒවා

අත්දැකීම් බවට පත්කරගෙන තිබෙනවා. දැන් නැවතත් එවැනි උපක්‍රමයක් රටට වලංගු නැහැ. එවැන්නකට ජ.වි.පෙ. කිසිසේත් මැදිහත්වෙන්නේ නැහැ.

වර්තමානයේ අප ගොඩනගන්නේ ජනතා බලවේග යන්ගේ උපායමාර්ගික හා ස්ථාවර ව්‍යාපාරයක්. ඒ තුළ ධනපති පන්තියට හෝ ධනපති පක්ෂවලට ඉඩක් නැහැ. ඒ වගේම වාමාංශිකයන් ලෙස වෙස්වලාගෙන සිටින ප්‍රතිවිප්ලවකාරී කල්ලි වලට හෝ අවස්ථාවාදීන්ටත් ඉඩක් නැහැ. මෙය පැහැදිළිවම වමේ නායකත්වයෙන් ගොඩනගන අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක්.

***26. ප්‍රශ්නයඃ- එම පෙරමුණේ සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ කවර දේශපාලන බලවේග විසින්ද?***

***ටිල්වින් සහෝදරයාඃ-*** සැබවින්ම එම පෙරමුණේ දේශපාලන නායකත්වය දැරීමේ වගකීම පැවරෙන්නේ, වමේ ව්‍යාපාරය ලෙස ජ.වි.පෙ.ටයි. ඉන් අදහස් කරන්නේ, අනෙක් බලවේග දෙවැනි කිරීමක් හෝ නොසලකා හැරීමක් නොවෙයි. එහෙත් සමාජවාදය ඉලක්ක කරගත් සැබෑ අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමේදී ඊට දේශපාලන මතවාදී හා සංවිධානමය නායකත්වය දිය යුත්තේ වමේ ව්‍යාපාරය විසිනුයි. එම මගපෙන්වීම හා නායකත්වය තුළ මීට පෙර අප සඳහන්කළ සැබෑ අධිරාජ්‍යවිරෝධී, දේශප්‍රේමී, ප්‍රගතිශීලී, සංවිධාන බලවේග හා පුද්ගලයන් ඒකාබද්ධ කරගත යුතු වෙනවා. අධිරාජ්‍යවාදය කෙතරම් අර්බුදයට පත්ව සිටියත් තවමත් ලොව මත සිය ආධිපත්‍යය පතුරුවමින් ඉන්නවා. අධිරාජ්‍යවාදය ස්ථිරවම පරාජය කළ හැකියි. එහෙත් වරක් ලෙනින් කියූ පරිදි ''අධිරාජ්‍යවාදයේ කටුව ඕනෑම 'කුකුල් පැටියෙකුට' බිඳ දැමිය හැකි එකක් නොවෙයි''. එයට දැවැන්ත ජනතා බලයක් අවශ්‍ය වෙනවා. ධෛර්යය අවශ්‍ය වෙනවා. සටන්කාමිත්වය, පරිත්‍යාග ශීලීත්වය අවශ්‍ය වෙනවා. උපාය උපක්‍රම තේරීමේ හැකියාව අවශ්‍ය වෙනවා. එම හැකියාව හොඳින්ම ඉටුකළ හැක්කේ දියුණු

වමේ ව්‍යාපාරයකින් මග පෙන්වනු ලබන ජනතා බලවේග යකටයි. වමේ නායකත්වය වැදගත් වන්නේ ඒ නිසයි. එසේම මෙය වෙනත් පන්තිමය වුවමනාවන්ට හැසිරවීමට නොහැකි ව්‍යාපාරයක් ලෙස ගොඩනැගීම අප ඉදිරිපිට ඇති අභියෝග යයි. එය ජය ගැනීම අපේ අධිෂ්ඨානයයි.

***27. ප්‍රශ්නයඃ- වර්තමාන සමාජය තදින් පරිභෝජනවාදයට සහ ස්වාර්ථකාමයට ගොදුරු වූ එකක්. එවැනි සමාජයක බොහෝ දෙනෙක් පොදු අරමුණක් සහිත ව්‍යාපාරයකට ඒකාබද්ධ කර ගන්නේ කෙසේද?***

***සෝමවංශ සහෝදරයාඃ-*** විවෘත වෙළඳපොළ ධනවාදී ප්‍රතිපත්ති එහෙම නැත්නම් නව ලිබරල් ධනවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු තමයි සමාජය අධි පරිභෝජනයටත් ස්වර්ථකාමයටත් ගොදුරු කිරීම. මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පටන් ගත්ත අලුතදී අධිපරිභෝජනයත්, අනිකාගේ බෙල්ල පාගා තවකෙක් ඉහළට ගමන් කිරීමත්, තනි තනිව ඉහළට යාමත් කළ හැකිය කියල හිතුවත් මේ වෙනකොට ඒ අරමුණු ඉටුකරගන්න බැරි බව මිනිසා තේරුම් ගනිමින් ඉන්නවා. සමාජය දෙපළු වී ඇත්තේ, ඇති 1%ටත් නැති 99% ටත් ලෙස බව පැහැදිලියි. මේ නිසා ලොව පුරා රටවල්වල ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා රටවල් තුළ පවා ප්‍රශ්න උග්‍රවෙලා. 99% ගොඩට වැටී සිටින වැඩකරන ජනතාවට ජීවන ප්‍රශ්න වැඩිවෙලා. ලක්ෂ ගණනකට රැකියා අහිමි වෙලා. තරුණයින්ට රැකියා කිරීමේ අවස්ථාව පවා අහිමි වෙලා. ශිෂ්‍යයන්ට ගාස්තු දරා ගන්න බැරි නිසා අධ්‍යාපනය අහිමි වෙලා. විශ්‍රාම ගිය අයගේ වැටුප පවා කප්පාදු කරනවා. ඉතින් මේ 99%ට අයිති හැම දෙනාටම මේ වෙනකොට අධි පරිභෝජනය අසීමිත ස්වර්ථකාමය ගෙනාපු නව ලිබරල් ධනවාදයට එරෙහිව වීදි බැසීම ආදී ක්‍රියාමාර්ගවලට යන්න බලකෙරෙනවා. මෑතකදී ලෝකයේ විශාලතම නගර 951ක සමගාමීව 99% ට අයිති ජනතාව වීදි බැහැලා පොදු අරමුණක් ප්‍රකාශයට පත් කළා.

ලොව පුරා 99% ජනතාව අද ඉල්ලන්නේ නව ලිබරල්වාදය එපා! සමාජ සාධාරණය ස්ථාපිත කරව්! කියලයි. ආරම්භයේදී පොදු අරමුණක් සහිත ව්‍යාපාරයකට එකතු වන්නේ තැකිය යුතු නැති තරම් සුළු පිරිසක්. නමුත් අසාධාරණය අයුක්තිය රජකරන සමාජයක් තුළ පොදු අරමුණක් සහිත සැබෑ අවංක ව්‍යාපාරයක් හැම මොහොතක් තුළම වේගයෙන් වැඩෙනවා. ඒ නිසා තමයි අයුක්තියට අසාධාරණයට විරුද්ධව කුඩා විරෝධතා ව්‍යාපාර අද ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ දැවැන්ත ව්‍යාපාරයක් වී තිබෙන්නේ. මේ සාමූහික ජනතා ව්‍යාපාරය නිසැක ලෙසම ගමන් කරන්නේ පොදු අරමුණක් කරාමයි. පවතින විෂයමූල තත්වය තුළ තම ජීවිතය හා අයිතීන් වෙනුවෙන් සටන්කිරීම හැර අන් විකල්පයක් නැති මොහොතක් ජනතාව ඉදිරියේ නිර්මාණය වෙනවා. එවැනි ජනතාවකට නායකත්වය දීමට විප්ලවවාදී ව්‍යාපාරය සමත් නම් ජයග්‍රහණය අනිවාර්ය වෙනවා. අධිරාජ්‍යවාදයේ විනාශයත් ජනතාවගේ ජයග්‍රහණයත් නියත ලෙසම සිදුවන බවට අප විශ්වාස කරනවා. ඒ විශ්වාසය මතයි අපි ක්‍රියාත්මක වෙන්නේ. කුමක් වුවත් අවසානයේ ජනතාව ජයගන්නවා.

## Promoting reconciliation and accountability in Sri Lanka

The Human Rights Council,

Guided by the Charter of the United Nations, the Universal Declaration of Human Rights, the International Covenants on Human Rights and other relevant instruments,

Recalling Council resolutions 5/1 and 5/2 on institution building of the Human Rights Council,

Reaffirming that States must ensure that any measure taken to combat terrorism complies with their obligations under international law, in particular international human rights, refugee and humanitarian law, as applicable,

Taking note of the report of the Lessons Learnt and Reconciliation Commission of Sri Lanka and its findings and recommendations, and acknowledging its possible contribution to the process of national reconciliation in Sri Lanka,

Welcoming the constructive recommendations contained in the Commission's report, including the need to credibly investigate widespread allegations of extra-judicial killings and enforced disappearances, demilitarize the north of Sri Lanka, implement impartial land dispute resolution mechanisms, re-evaluate detention policies, strengthen formerly independent civil institutions, reach

a political settlement on the devolution of power to the provinces, promote and protect the right of freedom of expression for all and enact rule of law reforms,

Noting with concern that the report does not adequately address serious allegations of violations of international law,

1. Calls upon the Government of Sri Lanka to implement the constructive recommendations made in the report of the Lessons Learnt and Reconciliation Commission and to take all necessary additional steps to fulfill its relevant legal obligations and commitment to initiate credible and independent actions to ensure justice, equity, accountability and reconciliation for all Sri Lankans;

2. Requests the Government of Sri Lanka to present, as expeditiously as possible, a comprehensive action plan detailing the steps that the Government has taken and will take to implement the recommendations made in the Commission's report, and also to address alleged violations of international law;

3. Encourages the Office of the United Nations High Commissioner for Human Rights and relevant special procedures mandate holders to provide, in consultation with, and with the concurrence of, the Government of Sri Lanka, advice and technical assistance on implementing the above-mentioned steps; and requests the Office of the High Commissioner to present a report on the provision of such assistance to the Human Rights Council at its twenty-second session.

# යෝජනාවේ සිංහල පරිවර්තනය

ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම
මානව හිමිකම් කවුන්සලය,
එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ අනෙකුත් අදාල නියමයන්ගේ මග පෙන්වීම අනුව,
මානව හිමිකම් කවුන්සිලයේ ආයතන පිහිටුවීම පිළිබඳ 5/1 සහ 5/2 වගන්ති සිහිපත් කරමින්ද

ත්‍රස්තවාදය සමඟ සටන් වැදීමේදී රාජ්‍යයක් විසින් ගනු ලබන ඕනෑම පියවරක් ජාත්‍යන්තර නීතියට විශේෂයෙන්ම මානව හිමිකම්, සරණාගත සහ මානුෂවාදී නීතියට වන තමන්ගේ බැඳීමට අනුකූල විය යුතු බව අවධාරණය කරමින්ද
ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව, එහි සොයාගැනීම් හා නිර්දේශයන් සැලකිල්ලට ගනිමින්ද ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට එහි දායකත්වයක් ඇති බව හඳුනා ගනිමින්ද
නෛතික නොවන ඝාතන හා බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳව ප්‍රචලිත වී ඇති චෝදනා විධිමත් විමර්ශනයකට ලක් කිරීම, ශ්‍රී ලංකාවේ උතුර හමුදාකරණයෙන් මුදාගැනීම, අපක්ෂපාතී ඉඩම් ආරවුල් විසඳීමේ ක්‍රමවේදයක් ක්‍රියාවේ යෙදවීම, දඬුවම් පිළිවෙත නැවත ඇගයීමට ලක්කිරීම, පූර්වයෙන් නිදහස් වූ සිවිල් ආයතන ශක්තිමත් කිරීම, පළාත්වලට බලය බෙදීමේ දේශපාලන විසඳුමකට

ළඟාවීම, සියලු දෙනාගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්‍ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ නීතියේ පාලනය ස්ථාපනය කිරීම ඇතුළු කොමිසන් වාර්තාවේ අඩංගු සාධනීය දායකත්වයන් පිළිගනිමින්ද

වාර්තාව ජාත්‍යන්තර නීතියේ උල්ලංඝනය වීම් පිළිබඳ බරපතළ චෝදනා ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර නොමැති බව සැලකිල්ලට ගනිමින්ද

1. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසන් වාර්තාවේ සාධනීය නිර්දේශයන් ක්‍රියාවේ යොදවන ලෙසත් සියලු ශ්‍රී ලාංකිකයින්ට, යුක්තිය, සමානාත්මතාව, වගවීම හා ප්‍රතිසන්ධානය තහවුරු කරන්නාවූ විශ්වාසනීය හා ස්වාධීන ක්‍රියාකාරකම් ඇරඹීමට තමන්ගේ අදාල නෛතික බැඳීම හා කැපවීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු අනෙකුත් පියවර ගන්නා ලෙසත් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.

2. කොමිසන් වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හා ගැනීමට ඇති ක්‍රියාමාර්ග විස්තර කරන විස්තීර්ණ ක්‍රියාකාරී සැලැස්මක් හැකි ඉක්මණින් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.

3. ශ්‍රී ලංකා ආණ්ඩුවේ අදහස් විමසීම හා එකඟතාවය අනුව ඉහත සඳහන් පියවරයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදෙස් හා තාක්‍ෂණ සහාය දෙන ලෙසට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලයට හා අදාල විශේෂ බලය ලත් පුද්ගලයින්ට අනුබල දෙයි. එසේම මානව හිමිකම් කවුන්සලයේ 22වන සැසිවාරයේදී එවැනි සහාය වීමේ විධිවිධානයන් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මහකොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලා සිටී.